## දේශීය වෛද්‍ය අමාත්‍යාංශය

# ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාව

## වාර්ෂික වාර්තාව - 2013

# වාර්ෂික වාර්තාව - 2013

## පටුන

ගරු සභාපතිතුමාගේ පණිවුඩය


| | | |
|---|---|---|
| **(01)** | අධ්‍යක්ෂ මණ්ඩල වාර්තාව | 01 - 13 |
| **(02)** | විගණකාධිපති වාර්තාව | 14 - 26 |
| **(03)** | ගිණුම් ප්‍රතිපත්ති | 27 - 31 |
| **(04)** | ශේෂ පත්‍රය | 32 |
| **(05)** | නිෂ්පාදන වෙළඳ හා ලාභ'ලාභ ගිණුම | 33 - 34 |
| **(06)** | මුදල් ප්‍රවාහ ප්‍රකාශය | 35 |
| **(07)** | ස්කන්ධ ප්‍රාග්ධනය වෙනස්වීම් ප්‍රකාශය | 36 |
| **(08)** | ගිණුම් පිළිබඳ සටහන් | 37 - 38 |

**සභාපතිතුමාගේ පණිවිඩය,**

2013 වර්ෂයේ ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාවේ ප්‍රගතිය සම්බන්ධයෙන් පණිවිඩයක් ලබා දීමට අවස්ථාවක් ලබා දීම ගැන මම බෙහෙවින් සතුටට පත්වෙමි.

වසර 44ක දීර්ඝ ඉතිහාසයක් ඇති ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාවට සභාපතිවරයෙකු ලෙස 2007 වර්ෂයේදී අතිගරු ජනාධිපති තුමා විසින් මා පත් කරන ලදී. එතැන් සිට පාඩු ලබමින් සිටි ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාව ලාභ ලබන තත්ත්වයට පත් කිරීම සඳහා මා ඇතුළු මාගේ කාර්යය මණ්ඩලය දිවා රෑ නොබලා ඇපකැප වී සේවය කරන ලදී.

එහි ප්‍රතිඵලයක් වශයෙන් 2008 වර්ෂයේ සිට මේ දක්වා ලාභ ලබන රාජ්‍ය සංස්ථා ගණයට ඇතුලත් වීමට අප හට හැකි විය. දේශීය වෙදකම නංවාලීම සඳහා **මහින්ද චින්තන ඉදිරි දැක්ම** අනුව කටයුතු කළ අප ආයතනය පැල්පතේ සිට සිටු මැඳුර දක්වා ගිලනුන් සුවපත් කිරීම සඳහා මහගු කාර්යයක් ඉටු කර ඇත.

එම කාර්යයේදී ගැටළු රාශියකට මුහුණපෑමට සිදුවූ අතර, ගුණාත්මක භාවයෙන් යුතු අමුද්‍රව්‍ය අවශ්‍ය ප්‍රමාණයෙන් සපයා ගැනීම, මිලදී ගන්නා ලද අමුද්‍රව්‍ය සහ නිමි ද්‍රව්‍ය ගබඩා කර ගැනීමට ප්‍රමාණවත් පහසුකම් නොමැති වීම ඒ අතර ප්‍රධාන තැනක් ගනී.

ඒ සඳහා විසඳුම් වශයෙන් අප දේශීය වෛද්‍ය අමාත්‍ය ගරු සාලින්ද දිසානායක මැතිතුමාගේ මගපෙන්වීම යටතේ ආදිවාසී ගම්මාන සියල්ල සම්බන්ධීකරණය කරමින් ඔවුන් විසින් සපයන ලද අමුද්‍රව්‍ය මිලදී ගැනීමට කටයුතු කරන ලදී.

තවද, ගබඩා ප්‍රශ්නයට විසඳුමක් ලෙස මේ වන විටත් වැඩ ආරම්භ කර ඇති සිව් මහල් ගබඩා සංකීර්ණයේ කටයුතු තව දුරටත් කාර්යක්ෂම කිරීම සඳහා කටයුතු කරන ලදී. එමෙන්ම නිෂ්පාදන ධාරිතාවය වැඩි කිරීමට අවශ්‍ය යන්ත්‍රෝපකරණ මිළදී ගැනීමට මූල්‍ය ප්‍රතිපාදන මහා භාණ්ඩාගාරයෙන් ලබා ගැනීමටද කටයුතු කරන ලදී.

30 වසරක් පුරා පැවති යුද්ධය නිමාවීමත් සමඟම උතුරු - නැගෙනහිර ප්‍රදේශවල අප නිෂ්පාදන සඳහා ඉල්ලුමද ක්‍රමයෙන් වැඩි විය. ඒ අනුව, පවත්නා නිෂ්පාදන ධාරිතාවය යටතේ අප වෙළඳපොල ඉල්ලුමට සරිලන අඛණ්ඩ සැපයුමක් සැපයීම සඳහා නිෂ්පාදන කටයුතු පුළුල් කිරීම පිළිබඳව මා ඇතුළු අධ්‍යක්ෂ මණ්ඩලයෙහි අවධානය යොමු වී ඇත. එම කටයුතු වල මූලික පියවරයන් මේ වන විට අවසන් කර ඇති අතර, අවශ්‍ය යන්ත්‍ර සූත්‍ර ආනයනය කිරීම ඉදිරි වර්ෂයේදී සිදු කරනු ඇත. මෙවැනි ගැටළු රාශියක් මධ්‍යයේ සේවකයින්ගේ සේවක තෘප්තිය හා සුබසාධක කටයුතු ඉහළ නංවමින් ලාභ ලබන සංස්ථාවක් ලෙස ඉදිරියට යාම අප ලැබූ භාග්‍යයක් කොට සළකමි.



ඩී.ඩී. සෝමවීර චන්ද්‍රසිරි

සභාපති,
ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාව.

## ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාව අධ්‍යක්ෂ මණ්ඩල වාර්තාව - 2013 වර්ෂය

1971 අංක 38 දරණ මුදල් පනතේ අංක 142 වගන්තියට අනුකූලව 2013.12.31 වෙනි දිනෙන් අවසන් වර්ෂය සඳහා ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාවේ ක්‍රියාකාරිත්වය පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩල වාර්තාව දේශීය වෛද්‍ය ගරු ඇමතිතුමා වෙත ගෞරවයෙන් පිළිගන්වමි.

**(01)** හැඳින්වීම

1957 අංක 49 දරණ රජයේ කාර්මික නීතිගත සංස්ථා පනත යටතේ 1969 මැයි 11 වෙනි දින අංක 14853/3 දරණ ලංකා ආණ්ඩුවේ අති විශේෂ ගැසට් නිවේදනයෙන් එවකට සිටි කර්මාන්ත හා ධීවර කටයුතු පිළිබඳ ගරු ඇමතිතුමා විසින් ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාව ස්ථාපනය කරන ලදී.

**(02)** දැක්ම

සෞඛ්‍ය සම්පන්න ජන සමාජයක් අරභයා දේශීය වෛද්‍ය විද්‍යාවේ අනන්‍යතාවය ආරක්ෂා කරගනිමින් ජාතික හා ජාත්‍යන්තර ඖෂධ අවශ්‍යතා උසස් ප්‍රමිතීන්ගෙන් යුතුව සපුරාලන සේවය මුල් කරගත් පුරෝගාමී ආයතනයක් වීම.

**(03)** මෙහෙවර

උසස් ප්‍රමිතියකින් යුක්ත ආයුර්වේද ඖෂධ නිෂ්පාදනය, ආනයනය, බෙදාහැරීම, පර්යේෂණ, සේවා සැපයීම හා සංරක්ෂණය තුළින් ජනතා අවශ්‍යතා සපුරාලන අතරම සේවක අභිවෘද්ධිය ඇති කිරීම සහ සමාජ සුභසාධනය ඉටු කරලමින් සෞඛ්‍ය සම්පන්න සමාජයක් අරභයා පුරෝගාමීව කටයුතු කිරීම.

**(04)** ප්‍රධාන අරමුණු

**01.** ආයුර්වේද ඖෂධ වර්ග භෛසජ්ජ ද්‍රව්‍ය හා සකස් කළ ආයුර්වේද ඖෂධ උසස් ප්‍රමිතීන්ගෙන් යුතුව නිෂ්පාදනය කිරීම.

**02.** රාජ්‍ය, පළාත් සභා සහ ප්‍රාදේශිය සභාවලට ඖෂධ අවශ්‍යතා මුළුමණින්ම සපුරාලන අතර තරඟකාරී ආයුර්වේද ඖෂධ වෙළඳ පොළ ප්‍රධාන සැපයුම්කරු වීම.

**03.** ඖෂධ නිෂ්පාදනයෙහි අත්‍යාවශ්‍ය ආයුර්වේද සිද්ධ, යුනානි, අමු ඖෂධ වර්ග ආනයනය කිරීම හා දේශීය වෙළඳ පොළ අවශ්‍යතාවලට අලෙවි කිරීම.

**04.** ආයුර්වේද ඖෂධ නිෂ්පාදනයට අවශ්‍ය දේශීයව නිපදවන අමු ආයුර්වේද ඖෂධ වර්ග යාවත්කාලීන සහතික මිල ක්‍රමයක් යටතේ මිලදී ගෙන ගබඩා කර සාධාරණ මිලට අලෙවි කිරීම සහ එමඟින් නිෂ්පාදක ගොවීන්ට සුරක්ෂිතභාවයක් හා උපරිම මිලක් ලබා ගැනීමට සැලැස්වීම.

**05.** ඖෂධ නිෂ්පාදනය සඳහා අවශ්‍ය වන ඖෂධ පැලෑටි සංරක්ෂණය කිරීම සහ වගාවන් ව්‍යාප්ත කිරිම සඳහා වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම.

**06.** ඖෂධ නිෂ්පාදනයේ ගුණාත්මක භාවය වර්ධනය සඳහා ආයුර්වේද ඖෂධ පිළිබඳ ශාස්ත්‍රීය සහ භෛසජ්ජක ද්‍රව්‍ය පර්යේෂණය කිරීම සහ එබඳු ඖෂධ වර්ග ප්‍රමිති කිරීම.

**07.** ආයුර්වේද ඖෂධාගාර පවත්වාගෙන යෑම සහ ඖෂධ වර්ග නිෂ්පාදනය සඳහා අවශ්‍ය ආයුර්වේද ඖෂධ වර්ග නිපදවීම.

**08.** ආයුර්වේද ඖෂධ නිෂ්පාදනයට අවශ්‍ය තහනම් ඖෂධ සහ පුපුරණ ද්‍රව්‍ය ඖෂධ නීත්‍යානුකූලව ලබාගෙන ඖෂධ නිෂ්පාදනය කරනු ලබන වෛද්‍යවරුන්ට නීත්‍යානුකූලව ලබා දීම මඟින් පාරම්පරික වෛද්‍ය ක්‍රමය රැක ගැනීමට ක්‍රියා කිරීම.

## (05) ව්‍යාපාර ස්ථාන

### 5.1 ප්‍රධාන කාර්යාලය සහ නිෂ්පාදනාගාරය

මහරගම නාවින්න පාරේ අංක 94 දරණ ස්ථානයේ පිහිටා ඇත.

### 5.2 අලෙවි මධ්‍යස්ථාන

| | |
|---|---|
| විජේරාම (වෛද්‍ය සායනයද සමඟ) | : අංක 22, ශ්‍රී සෝරත මාවත, ගංගොඩවිල, නුගේගොඩ |
| මහනුවර (වෛද්‍ය සායනයද සමඟ) | : අංක 70, යටිනුවර වීදිය, මහනුවර. |
| දියතලාව | : සනානි මන්දිරය, දියතලාව |
| අනුරාධපුරය (වෛද්‍ය සායනයද සමඟ) | : අංක 561/86, මහජන පොළ පාර, නව බස් නැවතුම්පල, අනුරාධපුරය. |
| බදුල්ල | : අංක 35/36, මධ්‍යම බස්නැවතුම් පොල, බදුල්ල. |
| පිටකොටුව | : කොළඹ කොටුව දුම්රිය ස්ථානය, පිටකොටුව |
| නාවින්න | : අංක 94, පරණ කොට්ටාව පාර, නාවින්න මහරගම |
| රත්නපුරය | : අංක 32, බස්නැවතුම් පොල , රත්නපුරය. |
| තංගල්ල | : අංක 18, නව වෙළඳ සංකීර්ණය, යාය වත්ත ගොඩිගමුව , නෙටොල්පිටිය. |
| බත්තරමුල්ල | : විභාග දෙපාර්තමේන්තුව, පැලවත්ත බත්තරමුල්ල. |
| යාපනය | : පොදු වෙළඳ පොළ සංකීර්ණය, යාපනය. |
| ගාල්ල | : අංක 38 ,ඕල්කට් මාවත, ගාල්ල. |
| සෙත්සිරිපාය | : සෙත්සිරිපාය, බත්තරමුල්ල. |
| ජනකලා | : ජනකලා කේන්ද්‍රය, බත්තරමුල්ල. |
| මොණරාගල | : අංක 267, වැල්ලවාය පාර, මොණරාගල. |

## (06) අධ්‍යක්ෂ මණ්ඩලය

| | | | |
|---|---|---|---|
| 1. | ඩී.ඩී. සෝමවීර චන්ද්‍රසිරි මහතා | - | සභාපති |
| 2. | වෛද්‍ය සී.ටී.බී.සේනාරත්න මහතා | - | කළමනාකාර අධ්‍යක්ෂ |
| 3. | වෛද්‍ය බී. ඒ. රත්නපාල මහතා | - | අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික |
| 4. | රත්නසිරි කෝට්ටගේ මහතා | - | අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික |
| 5. | ආචාර්ය සරත් බුද්ධදාස මහතා | - | අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික |
| 6. | ජේ.ඩබ්.කේ.පේමරත්න මහතා | - | අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික |
| 7. | වෛද්‍ය ර්.එම්.පී.බී. ඒකනායක මහතා | - | අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික |
| 8. | ඒ.කේ. සෙනෙවිරත්න මහතා - | | භාණ්ඩාගාර නියෝජිත |

## (07) විධායක නිලධාරි මණ්ඩලය

| | | | |
|---|---|---|---|
| 1. | සභාපති | - | ඩී.ඩී. සෝමවීර චන්ද්‍රසිරි මහතා |
| 2. | කළමනාකාර අධ්‍යක්ෂ | - | වෛද්‍ය සී.ටී.බී.සේනාරත්න මහතා |
| 3. | නිෂ්පාදනාගාර කළමනාකරු | - | කේ.ඩී.එම්. අර්ජුන චන්ද්‍රසේකර මහතා |
| 4. | අලෙවි කළමනාකරු | - | බර්නාඩ් කාරියවසම් මහතා |
| 5. | සැපයුම් කළමනාකරු | - | දීපනී වන්නිආරච්චි මිය |
| 6. | මානව සම්පත් කළමනාකරු | - | ලංකා වරකාගොඩ මෙනවිය |
| 7. | මුදල් කළමනාකරු | - | කැළුම් පතිරවසම් මහතා |
| 8. | ගණකාධිකාරී | - | ඒ.ඩී.එස්. ඩී. තෙන්නකෝන් මිය |
| 9. | වෛද්‍ය නිලධාරී (රා.ආ.) | - | පැරකුම් ඒකනායක මහතා |
| 10. | කළමනාකරු සැලසුම් (රා.ආ.) | - | සෝමා නාමසිංහ මිය |
| 11. | සහකාර තත්ත්ව පාලන කළමනාකරු | - | හේමන්ත කස්තුරිආරච්චි මහතා |
| 12. | සහකාර පිරිවැය ගණකාධිකාරී | - | වීරවිජය ගුණසේකර මහතා |
| 13. | මාණ්ඩලික සහකාර | - | ලාල් රණසිංහ මහතා |
| 14. | පරිගණක දත්ත නිලධාරී | - | සංජීව් කුමාර් මහතා |
| 15. | සහකාර ඖෂධවේදී | - | නිල්මිණි ගුණසේකර මිය |
| 16. | සහකාර ඖෂධවේදී | - | දමයන්ති කොඩිකාර මිය |
| 17. | ප්‍රධාන ගබඩා පාලක | - | සුනිල් වල්පොල මහතා |
| 18. | ප්‍රධාන ආරක්ෂක නිලධාරී | - | රංජිත් සේනාරත්න මහතා |
| 19. | ජ්‍යෙෂ්ඨ කාර්මික නිලධාරී | - | අනුර තිලකරත්න මහතා |
| 20. | නිෂ්පාදන ප්‍රවර්ධන නිලධාරී | - | ත්‍රිෂාන්තා ලියනගේ මිය |

### අභ්‍යන්තර විගණන අංශය

| | | | |
|---|---|---|---|
| 1. | අභ්‍යන්තර විගණක | - | යූ. ජයරත්න මහතා |

## (08) කාර්ය මණ්ඩල සංයුතිය

2013 වර්ෂයේ සේවක මණ්ඩල සංයුතිය

| තනතුරු නාමය | කාර්යාලය | කෞතුකාගාරය | ඩිකේරාම | හාමිත්ත | මහනුවර | දියකලාව | බදුල්ල | අනුරාධපුරය | කොට්ටෙ | බත්තරමුල්ල | කෑගල්ල | රත්නපුර | මොණරාගල | ගාල්ල | සොත්ථිපාය | විභාග (ශූරපාය) | යාපනය | නිකවැරටිය | ජාතික ශිල්ප සභාව | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨ කළමනාකරුවන් | 1 | | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | | | 1 |
| කළමනාකරුවන් | 4 | 1 | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | | | 5 |
| කණිෂ්ඨ කළමනාකරුවන් | 6 | 8 | | | | | | | | | | | | | | | | | | 14 |
| කළමනාකාර සහකාර සේවා තාක්ෂණික නිලධාරීන් | 1 | 5 | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | | | 6 |
| කළමනාකාර සහකාර සේවා /තාක්ෂණික නොවන නිලධාරීන් | 29 | 24 | 1 | 1 | 1 | 1 | 1 | 1 | | - | 1 | 1 | 1 | - | - | 1 | 1 | | 1 | 65 |
| ප්‍රාථමික ශ්‍රේණිය අර්ධ ශිල්පීය නිලධාරීන් | - | 2 | | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | | | 2 |
| ප්‍රාථමික ශ්‍රේණිය ශිල්පීය නිලධාරීන් | | 10 | | | | | | | | | | | | | | | | | | 10 |
| ප්‍රාථමික ශ්‍රේණිය ශිල්පීය නොවන නිලධාරීන් | 21 | 107 | 2 | 2 | 1 | 1 | 1 | 2 | | - | 1 | 1 | | 2 | 2 | | 1 | 1 | 1 | 146 |
| කොන්ත්‍රාත් පදනම මත බඳවාගත් නිලධාරීන් | 1 | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | | | 1 |
| අනියම් කම්කරු / තාවකාලික කම්කරු | - | 15 | - | - | - | - | - | - | - | - | - | | 1 | - | - | 1 | - | | 1 | 18 |
| අනියම් පුහුණු කම්කරු (වෙනත්) | - | 8 | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | | | 8 |
| එකතුව | 63 | 180 | 3 | 3 | 2 | 2 | 2 | 3 | 0 | 0 | 2 | 2 | 2 | 2 | 2 | 2 | 2 | 1 | 3 | 276 |

**(09)**<u>සේවක දිරි දීමනා සහ සුබසාධනය</u>

<u>සේවක දිරි ගැන්වීම්</u>

වඩාත් ඵලදායී හා කාර්යක්ෂම සේවයක් සඳහා සමස්ත කාර්ය මණ්ඩලයටම පැමිණීමේ දිරි දීමනාව, නිෂ්පාදනය මත පදනම් වූ නිෂ්පාදන දිරි දීමනාව හා ඵලදායීතා දීමනාව ලබා දීම ද ඊට අමතරව වාර්ෂිකව ප්‍රසාද දීමනා හා ලබා නොගත් වෛද්‍ය නිවාඩු සඳහා මුදල් ගෙවීමද සිදු කෙරේ.

<u>සේවක සුබසාධනය</u>

නිෂ්පාදන ක්‍රියාවලිය සඳහා සෘජුව සම්බන්ධ වන සියළුම සේවකයින් සඳහා නිල ඇඳුම් ලබාදෙන අතර, සංස්ථාවේ සියළුම සේවකයින් හා ඔවුන්ගේ පවුලේ සාමාජිකයින් සඳහා තෙදිනක වාර්ෂික විනෝද චාරිකාවක් යාම සඳහා සංස්ථාවේ අනුග්‍රාහකත්වය ලබා දී ඇත. අවමංගල්‍ය අවස්ථාවලදී අවශ්‍ය ප්‍රවාහන පහසුකම් ලබා දීම ඇතුළුව අනෙකුත් පහසුකම් ලබා දී ඇත.

**(10) ඖෂධ නිෂ්පාදනය නිෂ්පාදනය ඒකක වශයෙන් පහත දැක්වේ.**

| | ඖෂධ නාමය | ඒකකය | 2013 වර්ෂය | 2012 වර්ෂය | 2011 වර්ෂය | 2010 වර්ෂය | 2009 වර්ෂය |
|---|---|---|---|---|---|---|---|
| | | | | | | | |
| 1 | අරිෂ්ට/වයින් | මි.ලී.750 | 130,959.50 | 145,552.00 | 140,351.00 | 144,356.00 | 154,406.00 |
| 2 | ආසව | මි.ලී.750 | 142,933.00 | 112,948.00 | 124,483.00 | 134,150.00 | 136,063.00 |
| 3 | ක්වාථ | මි.ලී.750 | 60,393.34 | 45,945.00 | 65,506.00 | 66,606.00 | 50,034.00 |
| 4 | සිරප් | මි.ලී.750 | 17,768.63 | 20,140.00 | 21,812.00 | 27,861.00 | 19,736.00 |
| 5 | තෛල | මි.ලී.750 | 163,483.92 | 139,847.00 | 147,702.00 | 135,248.00 | 132,051.00 |
| 6 | චූර්ණ | කි.ග්‍රෑ. | 29,224.90 | 45,945.00 | 26,092.00 | 30,318.00 | 32,038.00 |
| 7 | කල්ක/ලේහ/ලේප | කි.ග්‍රෑ. | 22,173.40 | 19,945.00 | 18,360.00 | 22,311.00 | 17,316.00 |
| 8 | රස | කි.ග්‍රෑ. | 3,121.50 | 1,417.00 | 1,618.00 | 1,702.00 | 1,287.00 |
| 9 | වටිකා/ගුගුල් | කි.ග්‍රෑ. | 15,233.20 | 9,651.00 | 14,422.00 | 10,212.00 | 10,969.00 |
| 10 | **නව නිෂ්පාදන 01** | | | | | | |
| | (1) රණහංස රසායනය | කි.ග්‍රෑ. | 138.88 | 412.00 | 202.00 | 160.00 | 259.00 |
| | (2) ත්‍රිඵලා පෙති | කි.ග්‍රෑ. | 709.56 | 500.00 | 1,057.00 | 506.00 | 655.00 |
| | (3) මේදහරණී පෙති | කි.ග්‍රෑ. | 457.20 | 191.00 | 256.00 | 159.00 | 92.00 |
| | (4) මධුරු ධූපය | කි.ග්‍රෑ. | | | | | |
| | (5) සුපේෂී | කි.ග්‍රෑ. | 10.96 | 27.00 | 57.00 | 29.00 | 1,935.00 |
| | (6) මධුමේහ හරණී පෙති | කි.ග්‍රෑ. | | | | 3.00 | |
| 11 | **නව නිෂ්පාදන** | | | | | | |
| | (1) තැම්බුම් හොදි | ග්‍රෑ. 05 | 151,893.00 | 103,680.00 | 95,000.00 | 83,600.00 | 127,108.00 |
| | තැම්බුම් හොදි | ග්‍රෑ. 250 | | 1.00 | | | |
| | (2) පේයාව | ග්‍රෑ. 05 | 245,785.00 | 147,313.00 | 194,000.00 | 178,600.00 | 179,799.00 |
| | පේයාව | ග්‍රෑ. 250 | | 1.00 | | | |
| | (3) පස් පංගුව | ග්‍රෑ. 50 | 44,671.00 | 67,924.00 | 44,560.00 | 10,880.00 | 61,660.00 |
| | (4) කෝමාරිකා ෂැම්පූ | මි.ලී.95 | 723.20 | 8,626.00 | 6,263.00 | 5,294.00 | 4,004.00 |
| | (5) ඉරමුසු කුඩු | කි.ග්‍රෑ. | | 338.00 | 33.00 | - | - |
| | (6) බෙලිගැට මද කුඩු | කි.ග්‍රෑ. | | 560.00 | - | - | - |
| | **වෙනත් නිෂ්පාදන වර්ග** | | | | - | - | - |
| | (1) ANTI DIABETIC HERBLE TEA 25 BAGS | පෙට්ටි | | 32.00 | - | - | - |
| | (2) HERBLE CURRY SOUP 5g (EEPORT) | 5g | | 500.00 | - | - | - |
| | (3) MIXE HERBLE TEA 1.5g /06 BAGS (EXPORT) | Nos | | 4,320.00 | - | - | - |
| | (4) SPICY HERBLE TEA 5g (EXPORT) | 5g | | 500.00 | - | - | - |
| | (5) PANTA KASAYA 60g | කි.ග්‍රෑ. | | 141.00 | - | - | - |

**(11) රාජ්‍ය අංශයට සහ පෞද්ගලික වෙළඳ පොළට අලෙවි කරන ලද ඖෂධ වල වටිනාකම පහත පරිදි දැක්වේ.**

(රු. දස ලක්ෂ වලින්)

| | **2013 වර්ෂය** | **2012 වර්ෂය** | **2011 වර්ෂය** | **2010 වර්ෂය** | **2009 වර්ෂය** | **2008 වර්ෂය** |
|---|---|---|---|---|---|---|
| රාජ්‍ය අංශය | 336.49 | 315.98 | 294.76 | 263.9 | 250.71 | 219.3 |
| <u>අලෙවි මධ්‍යස්ථානය</u> | | | | | | |
| විජේරාම වෙද ගෙදර | 10.59 | 6.54 | 6.36 | 6.52 | 6.1 | 6.80 |
| ජංගම අලෙවිය | 0.33 | 0.12 | 0.27 | | 0.32 | 0.94 |
| මහනුවර අලෙවි මධ්‍යස්ථානය | 6.22 | 6.53 | 5.37 | 4.86 | 4.93 | 4.79 |
| දියතලාව අලෙවි මධ්‍යස්ථානය | 3.05 | 3.33 | 1.94 | 3.44 | 2.42 | 3.21 |
| අනුරාධපුරය අලෙවි මධ්‍යස්ථානය | 2.00 | 1.85 | 0.98 | 1.15 | 1.42 | 1.46 |
| බදුල්ල අලෙවි මධ්‍යස්ථානය | 2.94 | 2.65 | 1.77 | 1.63 | 1.49 | 1.57 |
| පිටකොටුව අලෙවි මධ්‍යස්ථානය | 2.22 | 4.15 | 3.66 | 2.89 | 2.39 | 2.36 |
| නාවින්න අලෙවි මධ්‍යස්ථානය | 12.86 | 9.78 | 9.28 | 8.14 | 7.81 | 6.70 |
| අංක 008 ගබඩාව | 19.86 | 23.54 | 20.38 | 16.48 | 13.66 | 10.11 |
| රත්නපුර අලෙවි මධ්‍යස්ථානය | 12.46 | 9.39 | 4.74 | 3.11 | 1.88 | 1.83 |
| තංගල්ල අලෙවි මධ්‍යස්ථානය | 2.09 | 1.25 | 2.17 | 1.10 | 1.07 | 0.10 |
| විභාග දෙපාර්තමේන්තුව අලෙවි මධ්‍යස්ථානය | 0.98 | 1.02 | 1.01 | 0.75 | 0.60 | 0.63 |
| යාපනය අලෙවි මධ්‍යස්ථානය | 4.53 | 2.89 | 2.07 | 1.01 | 0.31 | |
| ගාල්ල අලෙවි මධ්‍යස්ථානය | 5.58 | 4.65 | 3.68 | 1.04 | | |
| සෙත්සිරිපාය අලෙවි මධ්‍යස්ථානය | 1.67 | 1.20 | 0.21 | | | |
| ජනකලා කේන්ද්‍රය | 0.31 | 0.60 | 0.03 | | | |
| මොණරාගල අලෙවි මධ්‍යස්ථානය | 1.27 | 0.74 | | | | |
| **මුළු එකතුව** | **425.45** | **396.21** | **358.68** | **316.02** | **295.11** | **259.80** |

**(12)** ආදායම බෙදී ගිය අයුරු

| | 2013 | 2012 | 2011 | 2010 | 2009 | 2008 |
|---|---|---|---|---|---|---|
| විකුණුම් | 100.00 | 100.00 | 100.00 | 100.00 | 100.00 | 100.00 |
| අඩුකළා :- විකුණුම් පිරිවැය | 62.46 | 61.81 | 56.13 | 72.30 | 71.69 | 57.85 |
| දළ ලාභය | 37.54 | 38.19 | 43.87 | 27.70 | 28.31 | 42.15 |
| එකතුකළා - වෙනත් ආදායම් | 2.08 | 4.68 | 4.28 | 1.79 | 1.84 | 1.22 |
| එකතුව | 39.62 | 42.87 | 48.15 | 29.49 | 30.15 | 43.37 |
| අඩුකළා :- | | | | | | |
| ආයතන හා පරිපාලන වියදම් | 18.29 | 19.56 | 21.81 | 19.95 | 20.14 | 18.37 |
| විකිණීමේ හා බෙදා හැරීමේ වියදම් | 11.65 | 9.03 | 8.60 | 6.77 | 5.78 | 5.86 |
| මූල්‍ය වියදම් | 0.64 | 0.01 | 0.10 | 1.28 | 0.26 | 0.34 |
| වෙනත් වියදම් | - | 0.62 | - | - | - | - |
| **මුළු වියදම** | 30.58 | 29.22 | 30.51 | 28.00 | 26.18 | 24.57 |
| **මෙහෙයුම් ලාභය** | 9.04 | 13.65 | 17.64 | 1.49 | 3.97 | 18.80 |
| එකතුකළා - පොළී ආදායම් සහ මෙහෙයුම් | | | | | | |
| නොවන ආදායම් | 1.31 | 3.75 | 0.55 | 0.43 | 0.01 | 0.79 |
| බදු අඩුකිරීමට පෙර ලාභය | 10.35 | 17.40 | 18.19 | 1.92 | 3.98 | 19.59 |
| <u>අඩුකළා</u> | | | | | | |
| නිකවැරටිය ඔසු උයන (අලාභය) | 0.43 | 0.45 | 0.37 | 0.02 | - | - |
| <u>අඩුකළා</u> | | | | | | |
| බදු සඳහා වෙන්කිරීම් ප්‍රතිපාදන | 2.65 | 4.74 | 5.16 | 0.38 | 0.80 | 3.92 |
| **ශුද්ධ ලාභය** | **7.27** | **12.21** | **12.66** | **1.52** | **3.18** | **15.67** |

**(13) <u>ලාභ දායකත්වය (රු. මිලියන වලින්)</u>**

| | **2013** | **2012** | **2011** | **2010** | **2009** | **2008** |
|---|---|---|---|---|---|---|
| විකුණුම් | 425.45 | 396.22 | 358.68 | 316.02 | 295.12 | 259.81 |
| අඩුකළා :- විකුණුම් පිරිවැය | 265.72 | 244.90 | 201.33 | 228.48 | 211.58 | 150.31 |
| දළ ලාභය | 159.73 | 151.32 | 157.35 | 87.54 | 83.54 | 109.50 |
| එකතුකළා - වෙනත් ආදායම් | 8.848 | 18.55 | 15.34 | 5.64 | 5.43 | 3.18 |
| මුළු ආදායම | 168.58 | 169.87 | 172.69 | 93.18 | 88.97 | 112.68 |
| අඩුකළා :- | | | | | | |
| ආයතන හා පරිපාලන වියදම් | 77.82 | 77.55 | 78.23 | 63.04 | 59.43 | 47.71 |
| විකිණීමේ හා බෙදා හැරීමේ වියදම් | 49.56 | 35.80 | 30.86 | 21.39 | 17.07 | 15.23 |
| මූල්‍ය වියදම් | 9.48 | 0.07 | 0.37 | 4.03 | 0.76 | 0.87 |
| වෙනත් වියදම් | - | 2.49 | - | - | - | - |
| **මුළු වියදම** | 136.86 | 115.91 | 109.46 | 88.46 | 77.26 | 63.81 |
| **මෙහෙයුම් ලාභය** | 31.72 | 53.96 | 63.23 | 4.72 | 11.71 | 48.87 |
| එකතුකළා - පොළී ආදායම් | 6.78 | 1.45 | 0.83 | 0.57 | 0.02 | 2.05 |
| මෙහෙයුම් නොවන ආදායම් | 5.59 | 13.44 | 1.15 | 0.72 | | |
| නිකවැරටිය ඔසු උයන (අලාභය) | (1.83) | (1.79) | (1.33) | - | - | - |
| බදු සඳහා වෙන්කිරීම් ප්‍රතිපාදන | (11.28) | (18.78) | (18.52) | (1.20) | (2.34) | (10.18) |
| ශුද්ධ ලාභය | **30.98** | **48.28** | **45.36** | **4.81** | **9.39** | **40.74** |

## (14) ඖෂධ නිෂ්පාදනය සඳහා අමු ද්‍රව්‍ය ලබාගැනීමේ ගැටළු

ඖෂධ නිෂ්පාදනය සඳහා අවශ්‍ය වන අමුද්‍රව්‍ය වලින් බොහොමයක් මේ වනතෙක් ලබා ගනුයේ වනාන්තර ආශ්‍රයෙනි. මේ වන විට වනාන්තර ආරක්ෂා කිරීමේ නීති රීති දැඩිව ක්‍රියාත්මක වන හෙයින් ඒ ආශ්‍රිතව ලබාගත යුතුව ඇති ඖෂධ ලබාගැනීමේ අසීරුතාවයකට මුහුණපෑමට සිදුව ඇත. මෙම තත්ත්වය කාලයක සිට ඖෂධ නිෂ්පාදනයට සෘජුව බලපාන කරුණක්ව පවතී. මේ තත්ත්වය මගහැර ගැනීම සඳහා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය යටතේ තිබූ අක්කර 50 ක ගොවිපොලක් (නිකවැරටිය රන්දෙනිගම ඔසු උයන) ලබා දුන් අතර, මේ වන විට එහි ඖෂධ වගාවන් සඳහා සංවර්ධනය කරමින් පවතී. විශේෂයෙන් දේශීය වශයෙන් සොයා ගැනීමට අපහසු කටුවැල් බටු, ඉඟුරු වැනි ඖෂධ මෙම ගොවිපලේ වගා කිරීමට කටයුතු සූදානම් කර ඇත. මෙම ව්‍යාපෘතියෙන් ලැබෙන අමුද්‍රව්‍ය හා ඖෂධ සෘජුව සංස්ථාවේ නිෂ්පාදන කටයුතු සඳහා 2011 වර්ෂයේ සිට මේ දක්වා යොදාගෙන ඇති අතර, ඉදිරි කාලපරිච්ඡේදයේදීත් මෙම ඖෂධ වගාවන් පුළුල් කර හිඟ ඖෂධ ලබා ගන්නා ක්‍රම වේදයක් දැනට සකස් කර ඇත.

## (15) සංස්ථාවේ නිෂ්පාදනාගාරය සහ ගබඩා පහසුකම් පුළුල් කිරීම

සංස්ථාවේ නිෂ්පාදනයන් සඳහා මේ වන විට දේශීය මෙන්ම විදේශීය වශයෙන්ද වැඩි ඉල්ලුමක් පැවතීම හේතුවෙන් හොඳ වෙළඳපොලක් නිර්මාණය වී ඇත. සංස්ථාවේ නිෂ්පාදන වල වැඩිවීමක් අත්‍යාවශ්‍ය වේ. නිෂ්පාදන සඳහා අවශ්‍ය වන අමුද්‍රව්‍ය හා නිමි ඖෂධ ගබඩා කිරීමේ ඉඩ පහසුකම් නොමැතිවීමේ ගැටළුවක් පැවති හෙයින් අමාත්‍ය මණ්ඩල අනුමැතිය අනුව සිව්මහල් ගබඩා සංකීර්ණයක් ඉදිකිරීම සඳහා අවශ්‍ය සැලසුම් සකස් කර මහා භාණ්ඩාගාරයෙන් වෙන්කර දී ඇති රුපියල් මිලියන 40 ක ප්‍රතිපාදන යොදවා මෙම කාර්ය 2012 වර්ෂයේදී ආරම්භ කරන ලද අතර, ඒ තුළින් සංස්ථාවේ ගබඩා පහසුකම් පිලිබඳ ගැටළුව විසඳා ගැනීමට හැකිවනු ඇතැයි අපේක්ෂා කරමි. මෙම කාර්ය ඉටුකර ගැනීම සඳහා දැනටමත් ශ්‍රී ලංකා ඉංජිනේරු සංස්ථාව සමඟ අවශ්‍ය ගිවිසුම් අත්සන් කර ඉදිකිරීම් කටයුතු ආරම්භ කර ඇත.

තවද, දැනට පවතින නිෂ්පාදනාගාරය වසර 40 කට වඩා පැරණි බැවින් නවීන තාක්ෂණයට අනුකූලව නව නිෂ්පාදනාගාරයක් අවශ්‍යව ඇත. දැනට පවතින සංස්ථා ඖෂධ සඳහා දේශීය මෙන්ම විදේශීය ඉල්ලුමට අනුව සංස්ථාවේ නිෂ්පාදන සකස් විය යුතු අතර, ඒ සඳහා පෞද්ගලික අංශයත් සමඟ තරඟකාරීත්වයට මුහුණ දිය යුතුය. ඒ සඳහා නවීන තාක්ෂණයට අනුකූලව නව නිෂ්පාදනාගාරයක් ඉදිකිරීම සඳහා මූලික වශයෙන් අවශ්‍ය අක්කර 02 රූඩ් 03 පර්චස් 10.3 ක ඉඩමක් දැනට සංස්ථාවේ නිෂ්පාදනාගාරය පිහිටා ඇති ප්‍රදේශය තුළින්ම සොයා ගැනීමට හැකිවිය. සීමාසහිත ශ්‍රී ලංකා සමූපාකාර සංගමයට අයත් එම ඉඩම මහරගම පතිරගොඩ පාර අවටින් සොයා ගැනීමට හැකි වුණු අතර, එය මිල දී ගැනීම සඳහා අමාත්‍ය මණ්ඩලය අනුමැතිය ලැබුණු පසු, ඒ සඳහා අවශ්‍ය රුපියල් මිලියන 112.5 ක මුදලින් මිලියන 50 ක් මහාභාණ්ඩාගාරයෙන් ලබා දෙන ලදී. ඉතිරි මුදල සංස්ථාව විසින් එම දේපල උකසට තබා රාජ්‍ය බැංකුවකින් ණය මුදලක් ලෙස ලබා ගන්නා ලදී.

නවීන තාක්ෂණයට අනුකූලව නව නිෂ්පාදනාගාරයක් ඉදි කිරීම තුළින් සංස්ථාවේ නිෂ්පාදනවල පුළුල් වීමක් අපේක්ෂා කරන අතර ඒ තුළින් ඵලදායී හා ගුණාත්මක භාවයෙන් යුත් නිෂ්පාදන දේශීය මෙන්ම විදේශීය වෙළඳ පොලට ඉදිරිපත් කිරීමට හැකියාව ලැබෙනු ඇත.

**(16)** <u>විගණන හා කළමනාකරණ කමිටු පිහිටුවීම</u>

ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාව 2013 වර්ෂයේ විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් වාර 13 ක් පවත්වා ඇති අතර, එහිදී විගණකාධිපති විසින් නිකුත් කරන ලද විගණන විමසුම්ද, අභ්‍යන්තර විගණන අංශය විසින් නිකුත් කරනු ලබන විගණන විමසුම්ද සකාච්ඡා කර එහි දක්වා ඇති කරුණු නිවැරැදි කිරිම සඳහා අවශ්‍ය මග පෙන්වීම් සිදුකරනු ලැබේ. මෙයට අමතරව දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේ ලේකම්තුමාගේ ප්‍රධානත්වයෙන් අමාත්‍යාංශ මට්ටමින් විගණන හා කළමනාකරණ රැස්වීම් මාස 03 කට වරක් පවත්වන අතර, එහිදි විගණන විමසුම් වලට ගනු ලබන තීරණ ක්‍රියාත්මක කිරිමේ ප්‍රගතියද සලකා බලන ලදී.

2013 වර්ෂයේ සංස්ථාවේ විගණන හා කළමනාකරණ කමිටුවේ සාමාජික මණ්ඩලයේ විස්තර පහත දැක්වේ.

| | | |
|---|---|---|
| ඒ.කේ.සෙනෙවිරත්න මයා | - | කමිටු සභාපති |
| රත්නසිරි කෝට්ටගේ මයා | - | කමිටු සාමාජික |
| ආචාර්ය සරත් බුද්ධදාස මයා | - | කමිටු සාමාජික |
| ජේ.ඩබ්.කේ.ප්‍රේමරත්න මයා | - | කමිටු සාමාජික |
| ජේ.එම්.එච් පෙරේරා මිය | - | කමිටු සාමාජික |
| එම්.ජී.සී. පෙරේරා මිය | - | විගණන අධිකාරී වෙනුවට |
| යූ. ජයරත්න මහතා | - | කැඳවුම්කරු/කමිටු ලේකම් |

**(17) <u>මූල්‍ය කළමනාකරණය හා විගණන විමසුම් පිළිබඳ අදහස්</u>**

සංස්ථාවේ ගිණුම් පද්ධතිය තුළ පවතින විවිධ අඩුපාඩු හා පද්ධති දුර්වලතා පිළිබඳව විගණකාධිපති විසින් වරින් වර විගණන විමසුම් වලින් පෙන්වා දෙනු ලැබේ. මෙයට අමතරව පාර්ලිමේන්තු පොදු කාරක සභාවේද එම අඩුපාඩු පෙන්වා දුන් අතර, දැනටමත් එම අඩුපාඩු හා දුර්වලතා විගණන හා කළමනාකරණ කමිටුව විසින් දෙනු ලබන උපදෙස් හා මහ පෙන්වීම අනුව, අධ්‍යක්ෂ මණ්ඩලයේ නියෝග පරිදි අවශ්‍ය නිවැරදි කිරීම් කිරීමට 2013 වර්ෂයේදී ක්‍රියාමාර්ග ගෙන ඇති බව දන්වා සිටිමි.

ස්තුතියි.

- ❖ නිවැරදි මඟපෙන්වීමක් කළ දේශීය වෛද්‍ය ගරු සාලින්ද දිසානායක අමාත්‍යතුමාටත්, ලලිත් කන්නන්ගර ලේකම්තුමා ඇතුළු කාර්ය මණ්ඩලයටත්
- ❖ සංස්ථාවේ ප්‍රාග්ධන හා අයහාර වැඩිදියුණු කිරීම සඳහා සහාය දුන් මහාභාණ්ඩාගාරයටත්
- ❖ නොමඳ සහාය ලබාදුන් ආයුර්වේද දෙපාර්තමේන්තුවේ වත්මන් ආයුර්වේද කොමසාරිස් ඇතුළු කාර්ය මණ්ඩලයටත් ආයුර්වේද පර්යේෂණායතනයේ අධ්‍යක්ෂ ඇතුළු කාර්ය මණ්ඩලයටත්,
- ❖ නිමි ඖෂධ මිලදී ගැනීමට සහාය දැක්වූ පළාත් සභා, පළාත්පාලන සහ ප්‍රාදේශීය සභා මෙන්ම අලෙවි නියෝජිතයින්ටත්,
- ❖ පද්ධති පාලනයේ දුර්වලතා හා වැරදි අත්හැරීම් නිවැරදි කර ගැනීමට මඟපෙන්වීමක් කළ විගණකාධිපති ඇතුළු කාර්ය මණ්ඩලයටත්,
- ❖ සමාලෝචිත වර්ෂය තුළදී සංස්ථාවේ කටයුතු ඉදිරියට ගෙනයාම සඳහා ප්‍රශංසනීය සහයෝගයක් ලබාදුන් සංස්ථාවේ කළමනාකාරිත්වයට හා සේවක මණ්ඩලයටත් මාගේ හා අධ්‍යක්ෂ මණ්ඩලයේ ස්තුතිය පිරිනමමි.



(ඩී.ඩී. සෝමවීර චන්ද්‍රසිරි)
සභාපති
ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාව

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
**AUDITOR GENERAL'S DEPARTMENT**


| | | |
|---|---|---|
| මගේ අංකය / எனது இல. / My No. } එච්එම්/සී/ඒඩීසී/1/13/27 | ඔබේ අංකය / உமது இல. / Your No. } | දිනය / திகதி / Date } 2015 මැයි 29 දින |

සභාපති,

ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාව.

**ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාවේ 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව.**

---

ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාවේ 2013 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1957 අංක 49 දරන රාජ්‍ය කාර්මික සංස්ථා පනතේ 29 වන වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර සංස්ථාවේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත් කළයුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මුදල් පනතේ 13(7)(ඒ) වගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් සංස්ථාවේ සභාපති වෙත 2014 දෙසැම්බර් 23 දින නිකුත් කරන ලදී.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.


අංක 306/72, පොල්දුව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව, . - இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. · No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka
+94 11 2887028 34 · +94 11 2887223 · oaggov@sltnet.lk · www.auditorgeneral.gov.lk

1.3 විගණකගේ වගකීම

---

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදි. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරීවන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම් වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් සංස්ථාවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගැයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගැයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

---

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2013 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 2.2.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 01

මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයක වසරක් තුළ උපලබ්ධි වන වත්කම් පමණක් ජංගම වත්කම් යටතේ දැක්විය යුතු වුවද, මහජන බැංකුවෙන් ලබා ගත් මාස 180 ක කාලයකින් ගෙවිය යුතු රු. මිලියන 60 ක ණය මුදල වෙනුවෙන් ඇප වශයෙන් තබා ඇති ධනයෝජන බැංකු ගිණුමේ 2013 දෙසැම්බර් 31 දිනට ශේෂය වූ රු.360,000 ක මුදල එම ණය මුදල ගෙවා අවසන් වන තුරු මුදල් කර ගත නොහැකි වුවත් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ජංගම වත්කම් යටතේ දක්වා තිබුණි.

(ආ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 16

(i) සමාලෝචිත වර්ෂයේ අවසානයට ශුද්ධ අගය ශුන්‍ය වූ පිරිවැය රු.78,743,936ක දේපල පිරියත හා උපකරණ ප්‍රත්‍යාගණනය කර ඒවායේ වර්තමාන වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි.

(ii) දේපල පිරියත හා උපකරණ අයිතමවල ධාරණ අගය ක්ෂණිකව වෙනස්වීම් වලින් යුක්ත වන්නේ නම් වාර්ෂිකව ප්‍රත්‍යාගණනය කිරීම කළ යුතු වුවද, සංස්ථාව විසින් සමාලෝචිත වර්ෂයේදී රත්තරන් තොගය ප්‍රත්‍යාගණනය නොකර පෙර වර්ෂයේ ප්‍රත්‍යාගණන වටිනාකමට ගිණුම්ගත කර තිබුණි.

(iii) දේපල පිරියත හා උපකරණ භාවිතයට සුදුසු තත්ත්වයට පත්කළ පසු ක්ෂය කිරීම ආරම්භ කළ යුතු වුවත් සංස්ථාවේ ජල පිරිපහදු පද්ධතිය රු.18,588,229ක වියදමින් 2011 වර්ෂයේදී නිම කර 2013 ජනවාරි මාසයේ භාරදී තිබුණද එම වටිනාකම තවදුරටත් නොනිමි වැඩ ගිණුමේ දක්වා තිබු අතර ක්ෂය කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 18

ආදායම් ලෙස හඳුනා ගත යුත්තේ එම ආදායම් නිශ්චිත වශයෙන්ම ලැබෙන බවට සනාථ කර ගැනීමෙන් පසුව වුවත් 2010 වර්ෂයේදී ලැබිය යුතු ආදායම් ලෙස ගිණුම් ගත කර තිබුණු රු.750,797 ක වටිනාකම 2013 දෙසැම්බර් 31 දින තෙක් ලැබී නොතිබුණු අතර මෙය ලැබිය යුතු ආදායම් යටතේ දක්වා තිබුණි. මෙම ආදායම් කුමන ප්‍රභවයකින් ලැබිය යුතුද යන්න විගණනයට තහවුරු කර නොතිබුණි.

2.2.2 ගිණුම්කරණ ප්‍රතිපත්ති

ගිණුම්වල පහත සඳහන් හෙළිදරව් කිරීම් සිදුකර නොතිබුණි.

(අ) මූල්‍ය ප්‍රකාශන වල මුහුණතෙහි ඇතුළත් කිරීමට හැකියාවක් නොමැති තොරතුරු සටහන් මගින් අනාවරණය කළ යුතු වුවත්, සමාලෝචිත වර්ෂයේදී මිල කල නොහැකි කෞතුක වටිනාකමක් ඇති පහත සඳහන් අයිතම ගබඩාවල පැවතියද ඒවා සටහන් මගින් හෙළිදරව්කර නොතිබුණි.

| වර්ගය | ප්‍රමාණය |
|---|---|
| | කි.ග්‍රෑ. |
| මුතු සිප්පි | 86.35 |
| මුව අං | 52.01 |
| කස්තුරි ගුලි | 23.00 |
| දැලි පොතු | 3.00 |

(ආ) මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයක, විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයක, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනයක සහ මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශනයක ඉදිරිපත් කෙරෙන තොරතුරු වලට අතිරේක තොරතුරු සටහන් මගින් ඉදිරිපත් කළ යුතු වුවද, සමාලෝචිත වර්ෂයේදී සංස්ථාව විසින් විවිධ පුද්ගලයන්ට පරිත්‍යාග වශයෙන් ලබා දුන් රු.1,648,937ක් වටිනා පරිත්‍යාග වල පිරිවැය ගිණුම් වල ගලපා තිබුනද ඒ පිළිබඳව සටහන් මගින් හෙළිදරව් කර නොතිබුණි.

2.2.3 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂණය කරනු ලැබේ.

(ආ) සමාලෝචිත වර්ෂය අවසානයට ඉතිරිව තිබූ පිරිවැය රු.317,920 ක් වූ තොග අවසන් තොගයට ඇතුළත් කර නොතිබුණි.

(ආ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 07 ට අනුව මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ කාරක ප්‍රාග්ධන වෙනස්වීම් යටතේ උපචිත වියදම් වැඩිවීම රු.2,257,286 ක් වුවද, මුදල් ප්‍රවාහ ප්‍රකාශයට රු.259,852 ක් ලෙස ගැලපීම් සිදු කර තිබුණි.

(ඇ) 2009 වර්ෂයේදී රජරට නිෂ්පාදනාගාරයක් සෑදීම සඳහා දරන ලද රු.1,775,095 ක පිරිවැය නොනිමි වැඩ ගිණුමේ රු.1,808,795 ක් ලෙස සටහන් කිරීමෙන් රු.33,700 ක් ගිණුම් වල වැඩියෙන් දක්වා තිබුණි.

(ඈ) 2013 දෙසැම්බර් 31 දිනට ස්ථාවර තැන්පත් රු.52,136 ක් හා ස්ථාවර තැන්පත් පොළී රු.40,962 ක් අඩුවෙන් ගිණුම් ගත කර තිබුණි.

(ඉ) සංස්ථාව සතු ස්ථාවර තැන්පතු වලට ලැබෙන පොළියෙන් බැංකුව විසින් අඩු කර ගන්නා ලද රු. 33,972ක මුදල ගිණුම් ගත කර නොතිබුණි.

2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

---

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සංස්ථාව විසින් සපයනු ලබන ඖෂධ වල ප්‍රධාන ගැනුම්කරුවන් වන්නේ ආයුර්වේද දෙපාර්තමේන්තුව හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය වන අතර පියවීමට වසරක කාලය ඉක්මවූ රු.2,390,718 ක ණය ශේෂයෙන් සියයට 83 ක් නියෝජනය වූ අතර මෙම ණය ශේෂයෙන් රු.1,392,209 ක් වසර 05කට අධික කාලයක් අය නොවී පැවතුණි.

(ආ) සංස්ථාව විසින් රාජ්‍ය ආයතන 13ක් වෙත ණය පදනම මත ලබා දී ඇති ඖෂධ වෙනුවෙන් වසරක කාලය ඉක්ම වූ රු.2,390,718 ක හිඟ ශේෂයක් පැවතියද අදාළ ආයතන වලින් එකී මුදල් අය කර ගැනීමට කිසිදු පියවරක් ගෙන නොතිබුණි.

(ඇ) සංස්ථාවේ ණයට විකුණුම් අභ්‍යන්තර පාලන පටිපාටිය අනුව ණය අය කර ගැනීමේ කාල සීමාව දින 60 ක් වුවද 2013 වර්ෂයේ ආයතන 8 ක් වෙත සිදු කරන ලද ණයට විකුණුම් වලින් අය විය යුතු රු.1,558,432 ක ණය අයකර ගැනීමට අවශ්‍ය නිසි පියවර විගණිත දිනය වූ 2014 ජූලි 15 දින වන විටත් ගෙන නොතිබුණි.

2.4 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| | නීති, රීති, රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | **1971 අංක 38 දරන මුදල් පනතේ 10(5)** වගන්තිය | ඉදිරි වර්ෂයට අදාළ අයවැය ලේඛනය එම වර්ෂය එළඹීමට මාස තුනකට පෙර අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කළයුතු වුවත් සංස්ථාවේ 2013 වර්ෂයේ අයවැය ලේඛනය අනුමත කර තිබුණේ 2012 දෙසැම්බර් 24 දිනදිය. |
| (ආ) | **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | |
| (i) | මුදල් රෙගුලාසි 104 | (i) සමාලෝචිත වර්ෂය තුළ දී සිදු වූ වාහන අනතුරු දෙක සඳහා ප්‍රාරම්භක පරීක්ෂණයක් හෝ අවසන් පරීක්ෂාවක් සිදු කර නොතිබීම නිසා හානියේ ප්‍රමාණය, අනතුරට හේතුව හා ඒ සඳහා වගකිව යුතු පාර්ශව හඳුනා ගැනීමට නොහැකි වී තිබුණි.<br><br>(ii) එක් වාහනයක අලුත්වැඩියා වියදම රු.260,442 ක් වුවද රක්ෂණ අරමුදලින් රු.127,253 ක් පමණක් වන්දි වශයෙන් ගෙවා තිබුණි. |
| (iii) | මුදල් රෙගුලාසි 110 | සංස්ථාව විසින් හානි හා පාඩු ලේඛනයක් පවත්වා නොතිබුණි. |
| (iv) | මුදල් රෙගුලාසි 760 | භාණ්ඩ නැති වීම නොහොත් අඩුවීම සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි අනුව කටයුතු කර නොතිබුණි. |

| | | |
|---|---|---|
| (ඇ) | 2011 සැප්තැම්බර් 15 දිනැති අංක 58(2) දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | චක්‍රලේඛය ප්‍රකාරව සභාපති හා කළමනාකරණ අධ්‍යක්ෂ වෙත පිළිවෙලින් රු.60,000 ක් සහ රු.45,000 ක මාසික දීමනාවක් පමණක් හිමි වුවද, ඔවුන් වෙත පැමිණීමේ දීමනා, ඵලදායිතා දීමනා, නිෂ්පාදන දීමනා හා ප්‍රසාද දීමනා වශයෙන් පිළිවෙළින් 2012 වසර සඳහා රු.174,376 ක් සහ රු.148,062 ක්ද 2013 වසර සඳහා රු.200,505 ක් සහ රු.195,332 ක්ද ගෙවා තිබුණි. |
| (ඈ) | **1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය** | එකතුව රු.273,288,019 ක් වූ ස්ථාවර වත්කම් සඳහා ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා ගෙන ගොස් නොතිබුණි. |
| (ඉ) | අධ්‍යක්ෂ මණ්ඩල තීරණ අංක **10834** | සංස්ථාව විසින් පිළියෙල කළ නිවාඩු කාර්ය සංග්‍රහය අධ්‍යක්ෂ මණ්ඩල තීරණයෙන් අවලංගු කර තිබුණද නිලධාරීන් විසින් එකී අවලංගු කළ කාර්ය සංග්‍රහය ප්‍රකාරව නිවාඩු ලබාගැනීම සිදු කර තිබුණි. |

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂය සඳහා සංස්ථාවේ මෙහෙයුම් කටයුතු වල මූල්‍ය ප්‍රතිඵලය රු.42,255,668 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූපිව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.62,731,392 ක් වුයෙන් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ රු.20,475,724 ක පිරිහීමක් පෙන්නුම් කෙරුණි.වෙනත් ආදායම් රු.14,471,071 කින් අඩුවීම හා ශුද්ධ මූල්‍ය ආදායම රු. 5,985,655 කින් අඩුවීම මෙම පිරිහීමට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

### 3.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

පසුගිය වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් නොවන ආදායම රු.14,471,071 අඩු වී ඇති අතර එය ප්‍රතිශතයක් ලෙස 53.43 ක් විය.

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1. කාර්යසාධනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සංස්ථාවේ නිෂ්පාදන සැලැස්මට අනුව නිෂ්පාදන කටයුතු වෙනුවෙන් රු. 381,911,646 ක පිරිවැයක් දැරීමට අපේක්ෂිත වුවත් සත්‍ය පිරිවැය රු.282,328,813 වූයෙන් නිෂ්පාදන කටයුතු පසුගාමී තත්ත්වයක පවතින බවත් අපේක්ෂිත ඉලක්ක ලගාකර ගැනීම කෙරෙහි දැඩි අවධානය යොමු කළයුතු බවත් පහත දැක්වෙන දත්ත අනුව නිරීක්ෂණය කෙරේ.

| අයිතමය | සැලසුම්ගත නිෂ්පාදනය | සත්‍ය නිෂ්පාදනය | විචලනය | ප්‍රතිශතය |
|---|---|---|---|---|
| | ඒකක | ඒකක | | සියයට |
| අරිෂ්ට(මිලිලීටර් 750) | 197,700 | 130,443 | (67,257) | (34) |
| ආසව (මිලිලීටර් 750) | 128,400 | 143,450 | 15,050 | 12 |
| තෛල (මිලිලීටර් 750) | 185,516 | 163,331 | (22,185) | (12) |
| ක්වාථ (මිලිලීටර් 750) | 148,747 | 64,719 | (84,028) | (56) |
| සිරප් (මිලිලීටර් 750) | 35,246 | 17,769 | (17,477) | (50) |
| කෝමාරිකා ෂැම්පු(මිලිලීටර් 95) | 2,079 | 723 | (1,356) | (65) |
| චූර්ණ (කිලෝග්‍රෑම්) | 37,476 | 29,321 | (8,155) | (22) |
| කල්ක/ලේහ/ලේප/මෝදක(කිලෝග්‍රෑම්) | 34,145 | 24,431 | (9,714) | (28) |
| නව නිෂ්පාදන(කිලෝග්‍රෑම්) | 15,853 | 5,400 | (10,453) | (66) |
| රස/රසායනික (කිලෝග්‍රෑම්) | 4,201 | 3,250 | (951) | (23) |
| වතිකා ගුලි (කිලෝග්‍රෑම්) | 16,830 | 11,238 | (5,592) | (33) |

(ආ) සමාලෝචිත වර්ෂය තුළ රාජ්‍ය අංශයට රු. 395,488,000 ක අලෙවියක් සිදු කිරීම අපේක්ෂාව වුවද ඉහත තත්ත්වය මත වර්ෂය තුළ කරන ලද සත්‍ය අලෙවි ආදායම රු.336,196,557 ක් වූයෙන් අයවැය ගත අලෙවි ආදායම සත්‍ය අලෙවි ආදායම සමඟ සැසඳීමේදී සත්‍ය අලෙවිය රු. 59,291,443 කින් අඩුවී තිබුණි.

4.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

2012 දෙසැම්බර් 31 දිනට සංස්ථාව විසින් ස්ථාවර තැන්පතුවල රු. 65,307,819 ක මුදලක් ආයෝජනය කර තිබියදී එම මුදල් උපයෝගී කර නොගෙන ඉඩමක් මිලදී ගැනිම සඳහා සියයට 15 ක පොලී අනුපාතයක් යටතේ මිලියන 60 ක ණය මුදලක් ලබා ගෙන තිබුණි.

4.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) අමු ද්‍රව්‍ය මිලදී ගැනිම

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) ගබඩාව වෙත අමුද්‍රව්‍ය භාරගෙන භාණ්ඩ ලැබීම් තුණ්ඩු (GRN) නිකුත් කිරීමට ප්‍රථම ආරක්ෂක අංශය විසින් මෙම අමුද්‍රව්‍ය පිළිබඳ පරීක්ෂා කර අදාල ඉන්වොයිස් පත්‍රය හා භාණ්ඩ ගැනුම් ඇණවුම සමඟ පරීක්ෂා කළ යුතු වුවද, බොහෝ අවස්ථාවන්හි භාණ්ඩ ලැබීම් තුණ්ඩු නිකුත් කිරීමෙන් පසු ආරක්ෂක අංශය විසින් භාණ්ඩ පරීක්ෂා කර තිබූ බව නිරීක්ෂණය විය.

(ii) ඖෂධ කමිටුව විසින් අමුද්‍රව්‍ය පරීක්ෂා කිරීමෙන් පසු පමණක් අමුද්‍රව්‍ය ගබඩාව වෙත ලබාගත යුතු වුවද, අවස්ථා 26කදී කමිටුව විසින් පරීක්ෂා කිරීමට පෙර අමුද්‍රව්‍ය ගබඩාව වෙත ලබා දී තිබූ බව නිරීක්ෂණය විය.

(iii) ඖෂධ කමිටුව විසින් අමුද්‍රව්‍ය පරීක්ෂා කිරීමෙන් තොරව ගබඩාව වෙත අමුද්‍රව්‍ය ලබාගෙන තිබුණු අවස්ථා නිරීක්ෂණය වූ අතර භාණ්ඩ මිලදී ගැනිම සඳහා ගැනුම් ඇණවුම් පත්‍ර නිකුත් කිරීමට ප්‍රථමයෙන් ගබඩාව වෙත භාණ්ඩ සැපයුම්කරු විසින් සපයා තිබුණු අවස්ථා නිරීක්ෂණය විය.

(iv) අමු ද්‍රව්‍ය නිෂ්පාදන ක්‍රියාවලිය සඳහා යොදවා ගැනීමට ප්‍රථම, එම අමු ද්‍රව්‍යයන් ඖෂධ නිෂ්පාදන ක්‍රියාවලිය සඳහා යොදවා ගැනීමට සුදුසු ප්‍රමිති මට්ටමක තිබේද යන්න පිළිබඳව ඖෂධ කමිටු නිර්දේශය ලබා ගත යුතු වුවත්, එලෙස ඖෂධ කමිටු නිර්දේශය ලබා ගැනීමට ප්‍රථමයෙන් අමු ද්‍රව්‍යය නිෂ්පාදන ක්‍රියාවලිය සඳහා යොදවා ගෙන තිබුණු බව නිරීක්ෂණය විය.

(ආ) වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) වාර්ෂික තොග ගණනයන් සිදු කරන නමුත් ඒ ඒ වර්ෂ වල හඳුනා ගන්නා ලද තොග අතිරික්තතා හා ඌනතා සම්බන්ධව අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කර නොතිබූ අතර භෞතික තොග ශේෂය වෙනුවට පොත් ශේෂය මූල්‍ය ප්‍රකාශන වලට ඇතුළත් කර තිබුණි.

(ii) 2013 වර්ෂයේ තොග සමීක්ෂණ කටයුතු සිදුකර නොතිබූ අතර පසුගිය වර්ෂ 6 තුළ සමීක්ෂණ මණ්ඩල මගින් හඳුනා ගන්නා ලද තොග අතිරික්තතා හා ඌනතා ප්‍රමාණය පිළිවෙලින් රු.7,978,555 ක් හා රු.6,087,865 ක් විය.

(ඇ) සමාලෝචිත වර්ෂය තුළ රු. 1,641,437 ක පරිත්‍යාග සිදුකර තිබූ නමුත් ඒ සඳහා අධ්‍යක්ෂක මණ්ඩල අනුමැතිය ලැබී නොතිබුණු අතර එසේ ලබාදුන් පරිත්‍යාග වලින් රු.367,395 ක පරිත්‍යාග ලබාදී තිබුණේ කාටද යන්න විගණනයට අනාවරණය නොකෙරුණි.

(ඈ) නිකවැරටිය ඔසු උයනේ මෙහෙයුම් වියදම් අධික වීම හා ඔසු උයනෙන් ලැබෙන අමු ද්‍රව්‍ය සීමිත වීම හේතුවෙන් 2011 සිට 2013 දක්වා රු.4,949,433 ක අලාභයක් ලබා තිබුණි.දිගින් දිගටම පවත්නා අලාභ අවමකර ඵලදායි ඔසු උයනක් ලෙස පවත්වා ගෙන යාම කෙරේ අවධානය යොමු කර නොතිබුණි.

4.4 ආර්ථික නොවූ ගනුදෙනු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) අවශ්‍යතාවය හඳුනා ගැනීමකින් තොරව 2011 වර්ෂයේදී මිලදී ගන්නා ලද, වයින් බෝතල් හා කිරල මූඩි වලින් 2013 දෙසැම්බර් 31 වන විට, වටිනාකම රු.989,603 ක් වූ වයින් බෝතල් 24,002 ක් හා වටිනාකම රු.623,000 ක් වූ කිරල මූඩි 28,000 ක් ගබඩාවෙහි ඉතිරි වී තිබුණි.

(ආ) රසායනාගාර වාර්තාව සහ වෛද්‍ය කමිටු වාර්තාව මගින් ප්‍රතික්ෂේප වී තිබියදී රු.1,980,000 ක් වටිනා මී පැණි කිලෝග්‍රෑම් 4,000 ක් 2012 ජූනි මාසයේදී පෞද්ගලික ආයතනයකින් මිලදී ගෙන තිබුණු අතර මෙම මිලදී ගැනීම් සම්බන්ධ වවුචර්පත්, මුදල් ලබාගත් බවට රිසිට්පත් හා වියදම් වලට අදාළ ලිපි ගොණු විගණනයට ඉදිරිපත් නොවිය.

4.5 හඳුනා ගන්නා ලද පාඩු

සංස්ථාව මගින් රු.5,930,284 ක වියදමින් නිෂ්පාදනය කල හැකිව තිබූ අඹුක හෂ්ම හා නාග හෂ්ම කිලෝග්‍රෑම් 200ක් රු.7,137,130 කට ආනයනය කිරීම නිසා රු. 1,206,846 ක පාඩුවක් සිදු වී තිබුණි.

4.6 අවිධිමත් ගනුදෙනු

සංස්ථාවේ නිවාඩු සංග්‍රහයේ 8.2 වගන්තිය අනුව පත්වීම ලද පළමු වර්ෂයේදී වෛද්‍ය නිවාඩු සඳහා හිමිකමක් නොතිබියදී ඊට පටහැනිව සංස්ථාවේ පළමු පත්වීම් ලද නිලධාරීන් හා සේවකයන්ට පළමු වර්ෂයේදී ඉතිරි කරන ලද වෛද්‍ය නිවාඩු සඳහා 2009 වර්ෂයේ සිට 2013 වර්ෂය දක්වා රු 15,064,122 ක් ගෙවා තිබුණි.

5. ගිණුම් කටයුතු භාවය සහ යහපාලනය

5.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2004 පෙබරවාරි 24 දිනැති භාණ්ඩාගාර චක්‍රලේඛ අංක 01/2004 ප්‍රකාරව ව්‍යවස්ථාපිත මණ්ඩලවල වාර්ෂික මූල්‍ය ප්‍රකාශන ගිණුම් වර්ෂය අවසන් වී දින 60ක් ඇතුළත විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවද සංස්ථාවේ 2013 වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන 2014 නොවැම්බර් 27 දින ඉදිරිපත් කර තිබුණි. මේ අනුව ගිණුම් ඉදිරිපත් කිරීමේ ප්‍රමාදය මාස 09ක් විය.

5.2 ක්‍රියාකාරී සැලැස්ම

පහත සඳහන් කරුණු නිරීක්ෂණ කරනු ලැබේ.

(i) ක්‍රියාකාරී සැලැස්මෙහි දක්වා ඇති කළ යුතු වැඩපත් සංඛ්‍යාව හා වර්ෂය තුළ සත්‍ය ලෙස සිදුකළ වැඩපත් අතර විචලතාවන් නිරීක්ෂණය විය. එසේම ක්‍රියාකාරී සැලැස්මේ දක්වා ඇති වැඩපත් 33ක නිමකළ යුතු ඒකක සංඛ්‍යාව අතරද විචලතාවන් නිරීක්ෂණය විය.

(ii) ක්‍රියාකාරී සැලැස්මෙහි ඇතුළත් අයිතම 17 ක් වර්ෂය තුළ නිෂ්පාදනය කර නොතිබුණු අතර ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් නොවූ අයිතම 8 ක් සංස්ථාව විසින් නිෂ්පාදනය කර තිබුණි.

(iii) ක්‍රියාකාරී සැලැස්ම හා සත්‍ය නිෂ්පාදනය සැසඳීමේදී සත්‍ය නිෂ්පාදනය සියයට 50 ට අඩු අවස්ථා 31 ක් නිරීක්ෂණය විය.

(iv) ක්‍රියාකාරී සැලැස්ම හා සත්‍ය නිෂ්පාදනය සියයට 50 ත් සියයට 75 ත් අතර ප්‍රතිශතයක් ගත් අවස්ථා 24 ක් නිරීක්ෂණය විය.

(v) විගණනය වෙත ඉදිරිපත් කරන ලද සාරාංශගත නිෂ්පාදන පිළිබඳ වාර්තාවෙහි හා මාසික නිෂ්පාදන සැලසුම් වාර්තාවන්ට අනුව සැලසුම්ගත නිෂ්පාදන පිරිවැය රු.381,911,645 ක් ලෙස දක්වා තිබුණි. මේ අනුව ක්‍රියාකාරි සැලැස්මෙහි සඳහන් සංශෝධන නිෂ්පාදන පිරිවැය හා විගණනය වෙත ඉදිරිපත් කරන ලද තොරතුරු ප්‍රකාරව දක්වා ඇති නිෂ්පාදන පිරිවැය අතර රු.5,000,000 ක විචලනයක් නිරීක්ෂණය විය.

5.3 නොවිසඳී ඇති විගණන ඡේද

පසුගිය විගණන වාර්තාවෙන් පෙන්වා දී ඇති නමුත් මෙතෙක් නිවැරදි කිරීම සඳහා ප්‍රමාණවත් අවධානයක් යොමු කර නොමැති අඩුපාඩු පහත දැක්වේ.

(අ) 2012 දෙසැම්බර් 24 දිනැති අංක 49 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛය අනුව රාජ්‍ය සංස්ථා සේවකයෙකුට ගෙවිය හැකි ප්‍රසාද දීමනා මුදල රු.7,500 ක් වුවද අමාත්‍ය මණ්ඩලයේ පූර්ව අනුමැතිය නොමැතිව රු.10,000 බැගින් ප්‍රසාද මුදල් වශයෙන් රු.2,263,166 ක් කාර්ය මණ්ඩලය වෙත ගෙවීම නිසා චක්‍රලේඛ නියමයන්ගෙන් බැහැරව රු.607,500 ක මුදලක් වැඩිපුර ගෙවා තිබුණි.

(ආ) බැංකු ගිණුම

(i) වසර 15 කට වඩා පැරණි මෙතෙක් හඳුනා නොගත් බැංකුවට බැර නොවූ රු.224,168 ක් වටිනා චෙක්පත් සම්බන්ධයෙන් මෙතෙක් ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

(ii) වසර 20 කට වඩා කාලයක සිට පවතින නිරවුල් නොකල රු.337,010 ක් වටිනා හඳුනා නොගත් ශේෂයන් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) පෞද්ගලික ආයතනයකින් මිලදීගත් රු.194,006 ක භාණ්ඩ වෙනුවෙන් එම ආයතනයට ගෙවීම් නොකර සංස්ථාවේ කළමනාකාර අධ්‍යක්ෂවරයාගේ ලිඛිත නියෝගය යටතේ පුද්ගලයකුගේ නමට චෙක්පත නිකුත් කර එම චෙක්පත ඔහු විසින්ම ලබා ගෙන තිබුණි.

(ඈ) වැඩපත් අංක 01283115 යටතේ මදුකා කැස්ස පැණිය නිෂ්පාදනය කිරීමේදී සිදු වූ සේවක අකාර්යක්ෂමතාව නිසා සංස්ථාවට රු.233,400ක අලාභයක් සිදුවී තිබුණි.

(ඉ) වැඩපත් අංක 009967 සහ 009979 යටතේ නිපදවන ලද ධාරණී සිරප් බෝතල් තුළින් දුර්ගන්ධයක් පැමිණීම හේතුවෙන් අලෙවියෙන් බැහැර කර තිබු ඖෂධවල වටිනාකම රු.65,720 ක් විය.

(ඊ) 2010 වර්ෂයේදී රු.1,775,095 ක් වැය කර රජරට නිෂ්පාදනාගාරය ඉදිකිරීම ආරම්භ කර අතරමඟ නවතා දමා තිබුණි.

(උ) 2012 ඔක්තෝබර් 12 දිනැති වවුචර් අංක 226/10/2012 මඟින් දේශීය වෛද්‍ය අමාත්‍යාංශය සඳහා නවදිල්ලි නුවර ලෝක සෞඛ්‍ය සංවිධාන කාර්යාලයක් ආරම්භ කිරීමට රු.3,000,000 ක මුදලක් ලබාදී ඇති බව නිරීක්ෂණය විය. මෙහි ප්‍රගතිය සම්බන්ධයෙන් කිසිදු ලිඛිත සාක්ෂියක් විගණනයට ඉදිරිපත් නොවුණි.

## 6. පද්ධති හා පාලනයන්

-------------------------

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින් වර සංස්ථාවේ සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතු වේ.

(අ) තොග

(ආ) ගිණුම්කරණය

(ඇ) වාහන පාලනය

(ඈ) කාර්ය මණ්ඩල පරිපාලනය

(ඉ) අමු ද්‍රව්‍ය මිලදී ගැනීම

(ඊ) ඖෂධ නිෂ්පාදන ක්‍රියාවලිය

ඩබ්ලිව්. පී. සී. වික්‍රමරත්න
විගණකාධිපති (වැඩබලන)

## ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාව

## නො. 94, පරණ කොට්ටාව පාර, නාවින්න, මහරගම

## ගිණුම් පිළියෙළ කිරීමේ පදනම සහ ගිණුම් ප්‍රතිපත්ති-2013

**1. අනුකූලතා ප්‍රකාශය**

මූල්‍ය ප්‍රකාශනයෙහි ඇතුළත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, ස්කන්ධ වෙනස් වීම් ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන්, ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය මගින් පළ කර ඇති ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන් සහ ශ්‍රී ලංකා රජයේ මුදල් රෙගුලාසි වලට අනුකූලව පිළියෙල කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2014 නොවැම්බර් 14 දින මූල්‍ය ප්‍රකාශන නිකුත් කිරීමට අනුමැතිය ලබා දෙන ලදී.

**2. මිනුම් පදනම**

මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි සඳහන් පහත දැක්වෙන ප්‍රමාණාත්මක අයිතමයන් හැරුණු කොට මූල්‍ය ප්‍රකාශන ඓතිහාසික පිරිවැය පදනම් කරගෙන පිලියෙළ කර ඇත.

(a) නිර්වචිත ප්‍රතිලාභ බැඳීම්, ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 19 හි නිර්දේශ කර ඇති ප්‍රක්ෂේපිත ඒකක ප්‍රතිලාභ ක්‍රමය පදනම් කරගෙන ඒවායේ වර්තමානය අගය යටතේ පෙන්වා ඇත.

(b) ව්‍යුත්පන්න නොවන මූල්‍ය සාධන පත්‍ර ඒවායේ සාධාරණ වටිනාකම යටතේ දක්වා ඇත.

මූල්‍ය ප්‍රකාශනයන්හි උද්ධමන සාධකය සඳහා කිසිදු ගැලපුමක් කර නොමැත.

**3. අඛණ්ඩ පැවැත්ම**

ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාවෙහි නුදුරු අනාගතයේ අඛණ්ඩ පැවැත්මට ඇති හැකියාව අධ්‍යක්ෂ මණ්ඩළය විසින් තක්සේරු කර ඇති අතර සංස්ථාව ඇවර කිරීමක් හෝ වෙළඳාම නතර කිරීමක් අපේක්ෂා නොකරයි.

**4. සංසන්දනාත්මක තොරතුරු**

මූල්‍ය ප්‍රකාශන වඩා හොඳින් ඉදිරිපත් කිරීමට සහ ප්‍රවර්තන වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සමග සැසඳීමට හැකි වන සේ අවශ්‍ය අවස්ථාවන්හිදී පෙර වර්ෂවල මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම වෙනස් කර යලි වර්ගීකරණය කර ඇත.

**5. ඇස්තමේන්තු හා විනිශ්චයන් යොදා ගැනීම**

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති හා අනුකූල වන සේ මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේදී මූල්‍ය ප්‍රකාශනවල හඳුනාගත් ප්‍රමාණයන්ට බලපාන විවිධ විනිශ්චය, උපකල්පන සහ ඇස්තමේන්තු, කළමනාකරණය විසින් සිදු කිරීම අවශ්‍ය වේ.

විනිශ්චයන් සහ ඇස්තමේන්තු, පෙර අත්දැකීම්, උපනති සහ පවතින තත්ත්වයන් යටතේ සාධාරණ යයි විශ්වාස කරනු ලබන අනාගත සිදුවීම් පදනම් කරගෙන කරනු ලබයි. ඒ අනුව සත්‍ය ප්‍රතිඵලය, විනිශ්චය සහ ඇස්තමේන්තුවට වඩා වෙනස් විය හැක.

ඇස්තමේන්තු සහ අදාළ උපකල්පනවල වලංගුභාවය නිරන්තරයෙන් පුනරීක්ෂණය කරනු ලබයි. යම් කාල පරිච්ඡේදයකට අදාළ ගිණුම් ඇස්තමේන්තු ප්‍රතිශෝධනය කර ඇත්නම් ප්‍රතිශෝධනය කළ කාල පරිච්ඡේදයට සහ බලපැවැත්වෙන ඉදිරි කාලපරිච්ඡේද වලට අදාළව එම වෙනස්කම හඳුනා ගෙන ඇත. ගිණුම්කරණ ප්‍රමිතීන් අනුව ගිණුම් පිලියෙළ කිරීමේදී තීරණාත්මක විනිශ්චයන් මූල්‍ය ප්‍රකාශන වල හඳුනාගත් ප්‍රමාණයන්ට වඩාත් සැලකිය යුතු බලපෑමක් ඇති කර ඇත්තේ පහත දැක්වෙන ගණනයන් කෙරෙහිය.

නිර්වචිත ප්‍රතිලාභ බැඳීම් මිණුම්කරණය

විලම්බිත බදු සම්බන්ධ වත්කම් සහ වගකීම් ගණනය

**6. විදේශ ව්‍යවහාර මුදල් ගනුදෙනු**

(a) ක්‍රියාකාරී සහ ඉදිරිපත් කිරීමේ ව්‍යවහාර මුදල්

සංස්ථාවෙහි මූල්‍ය ප්‍රකාශනයන්හි ඇතුළත් අයිතම, අස්තිත්වය ක්‍රියාකරන ප්‍රාථමික ආර්ථික පරිසරයෙහි ව්‍යවහාර මුදලින් (ක්‍රියාකාරී ව්‍යවහාර මුදල) දක්වා ඇත.

(b) ගනුදෙනු සහ ශේෂ

විදේශ මුදල් ගනුදෙනු, ක්‍රියාකාරී ව්‍යවහාර මුදලට පරිවර්තනය කර ඇත්තේ ගනුදෙනු සිදුවන දිනයන්හි පැවති විනිමය අනුපාත උපයෝගී කර ගනිමිනි.

**7. වත්කම් සහ ඒවායේ තක්සේරුකරණ පදනම**

මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ජංගම වත්කම් ලෙස වර්ගීකරණය කර ඇත්තේ මුදල්, බැංකු ශේෂයන් සහ සංස්ථාවේ සාමාන්‍ය ව්‍යාපාර චක්‍රය තුළ මුදල් බවට පත් කර ගැනීමට අපේක්ෂා කරන වත්කම්ය. ජංගම වත්කම් හැර අනෙකුත් වත්කම් වාර්තා කරන දිනයේ සිට වර්ෂයකට වැඩි කාලයක් සංස්ථාව විසින් රඳවා ගැනීමට අපේක්ෂා කරයි.

### 7.1 දේපළ, පිරියත සහ උපකරණ

දේපළ,පිරියත සහ උපකරණ වටිනාකම ලෙස දක්වා ඇත්තේ ඒවායේ පිරිවැයෙන් සමුච්චිත ක්ෂය සහ හානිකරන අලාභයක් ඇත්නම් එයද අඩු කළ පසු වටිනාකමයි. ශ්‍රී ලංකා ගිණුම් ප්‍රමිත අංක 01, ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත මුල්වරට සම්මත කර ගැනීම, හි සඳහන් පරිදි දේපළ, පිරියත සහ උපකරණ වල සාධාරණ වටිනාකම සංක්‍රාන්ති වන දිනයේ සලකනු ලබන පිරිවැය ලෙස පෙන්වීමට ඇති වෛකල්පික නිදහස් වීම සංස්ථාව විසින් තෝරා ගන්නා ලදී.

දේපළ, පිරියත සහ උපකරණ යටතේ දක්වා ඇති අයිතමයන්ගේ පිරිවැයට ගැණුම් මිල සහ ඒවා භාවිතා කළ හැකි තත්වයට ගෙන ඒමට වැය කළ ඍජු වියදම් ඇත්නම් ඒවාද ඇතුළත් වේ.

බැහැර කරන ලද දේපළ, පිරියත සහ උපකරණ අයිතමයන්ගේ ලාභය හෝ අලාභය තීරණය කර ඇත්තේ බැහැර කිරීමෙන් ලැබෙන උත්පාදන සහ දේපළ, පිරියත සහ උපකරණ වල ධාරණ අගය අතර වෙනසින් වන අතර එය විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයේ අනෙකුත් ආදායම් හෝ වියදම් යටතේ දක්වා ඇත.

### 7.2 ක්ෂය

ක්ෂය ගණනය කරනු ලබන්නේ ක්ෂය කළ හැකි අගය මතය. එනම් වත්කමක පිරිවැයෙන් හෝ පිරිවැය වෙනුවට ආදේශිත වෙනත් අගයකින් එහි අවශේෂ වටිනාකම අඩු කළ විට ලැබෙන අගය මතය. මූල්‍ය ප්‍රකාශනවල ක්ෂය හඳුනා ගනු ලබන්නේ සරල මාර්ග ක්‍රමයට දේපළ, පිරියත සහ උපකරණ වල එක් එක් කොටසට අයත් අයිතමයන්ගේ ප්‍රයෝජනවත් ජීවිත කාලය පුරාය.
ප්‍රවර්තන කාලපරිච්ඡේදයට හා සසඳන කාලපරිච්ඡේදයන්ට අදාළ අපේක්ෂිත ප්‍රයෝජනවත් ජීවිත කාල සහ ක්ෂය අනුපාතික පහත දැක්වේ.

| වත්කම් වර්ගය | ප්‍රයෝජනවත් ජීවිත කාලය (අවුරුදු) | ක්ෂය අනුපාතිකය (%) |
|---|---|---|
| ගොඩනැගිලි | අවුරුදු 20 | 5% |
| යන්ත්‍රෝපකරණ | අවුරුදු 06 මාස 08 | 15% |
| ජල සැපයීමේ උපකරණ | අවුරුදු 06 මාස 08 | 15% |
| රසායනාගාර උපකරණ | අවුරුදු 06 මාස 08 | 15% |
| කාර්යාලීය උපකරණ | අවුරුදු 10 | 10% |
| රථ වාහන | අවුරුදු 05 | 20% |
| ආයුධ හා මෙවලම් | අවුරුදු 03 | 33.33% |

වත්කමක ක්ෂය එය ප්‍රයෝජනයට ගන්නා දිනයේ සිට ගණනය කරන අතර එය විකිණුම සඳහා ඉදිරිපත් කිරීමට වර්ගීකරණය කරන දිනය හෝ වත්කම ඉවත් කරන දිනය යන දෙකින් පලමු දිනයේදී ක්ෂය කිරීම නවතනු ලැබේ.

### 7.3 නොනිමි වැඩ

වාර්තා කරනදිනය වන විට නොනිමි වැඩ සඳහා වැය වූ ප්‍රග්ධන වියදම් නොනිමි වැඩ ලෙස මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි දක්වා ඇති අතර ප්‍රවර්තන වර්ෂය ඇතුළත වැඩ අවසන් කර ප්‍රයෝජනයට ගත් වත්කම් දේපළ, පිරියත සහ උපකරණ යටතේ පෙන්වා ඇත.

## 8. මූල්‍ය වත්කම්

සංස්ථාව මූල්‍ය වත්කම් පහත දැක්වෙන ආකාරයට වර්ගීකරණය කර ඇත. ලාභ හෝ අලාභ මගින් මූල්‍ය වත්කම් සාධාරණ අගයට, ණය සහ ලැබිය යුතු දෑ, විකිණීම සඳහා ඇති මූල්‍ය වත්කම් සහ පරිණත වීම තෙක් තබාගන්නා ආයෝජන යනුවෙනි. මූල්‍ය වත්කම අත්පත් කරගන්නා අරමුණ මත වර්ගීකරණය රඳා පවතියි.වාර්තා කරන කාලපරිච්ඡේදයේ සහ වාර්තා කරන දිනට සංස්ථාව සතුව ලාභ හෝ අලාභ මගින් සාධාරණ අගයට වර්ගීකරණය කරන ලද මූල්‍ය වත්කම් කිසිවක් නොමැත. සියලුම මූල්‍ය වත්කම් සාධාරණ වටිනාකමට, ගණුදෙනු පිරිවැය එකතු කර හඳුනාගෙන ඇත.

## 9. තොග

තොගය දක්වා ඇත්තේ පිරිවැය හෝ ශුද්ධ උපලබ්ධි යන දෙකෙන් අඩු අගය පදනම් කරගෙනය. තොගවල පිරිවැය ලෙස දක්වා ඇත්තේ තොග මිලදී ගැනීමේ පිරිවැය, තොග වෙන් කිරීමේ පිරිවැය (පරිවර්තන පිරිවැය) හා පවතින තොග වර්ථමාන භාවිතයට දැරූ වියදම්ය.

## 10. වෙළඳ ණයගැතියෝ

සංස්ථාව විසින් වෙළඳ ණය ගැතියන් ලෙස මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි හඳුනා ගෙන ඇත්තේ සංස්ථාවට මුදල් හෝ වෙනත් මූල්‍යමය වත්කමක් ලැබීමට ගිවිසුම් ගත හිමිකමක් ඇත්නම් පමණකි.

## 11. මුදල් හා මුදල් සමාන දෑ

මුදල් සහ මුදල් සමාන දෑ ලෙස නිර්වචනය කර ඇත්තේ අත ඇති මුදල්, බැංකු ජංගම ගිණුම් ශේෂ සහ ඉහල ද්‍රවශීලීත්වයකින් යුතු කෙටි කාලීන තැන්පතුය. මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ මුදල් හා මුදල් සමාන දෑ සමන්විත වන්නේ අත ඇති මුදල්, සහ බැංකු තැන්පතුය.

## 12. වගකීම් සහ වෙන්කිරීම්

වාර්තා කරන දිනයේ සිට වර්ෂයක් ඇතුළත ඉල්ලා සිටි අවස්ථාවක ගෙවිය යුතු ගෙවීම් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ වගකීම් යටතේ ජංගම වගකීම් ලෙස වර්ගීකරණය කර ඇත. ජංගම නොවන වගකීම් යනු වාර්තා කරන දිනයේ සිට වර්ෂයකට වැඩි කාලයකදී ගෙවිය යුතු ශේෂ වේ. මූල්‍ය ප්‍රකාශන පිලියෙළ කිරීමේදී හඳුනා ගත් සියලුම වගකීම් ගිණුම් ගත කර ඇත.

වෙන් කිරීමක් හඳුනා ගෙන ඇත්තේ අතීත සිදුවීමක ප්‍රතිඵලයක් ලෙස සංස්ථාවට විශ්වාසනීය ලෙස ඇස්තමේන්තු කළ හැකි සම්මුතික හෝ නීතිමය බැඳීමක් තිබෙන අවස්ථාවක එම බැඳීම පියවීමට ආර්ථික ප්‍රතිලාභයක් ගෙවීමට සම්භාවිතාවක් ඇති අවස්ථාවකදීය.

**13. මහා භාණ්ඩාගාරයේ දායකත්වය**

ප්‍රග්ධන වත්කම් සඳහා මහා භාණ්ඩාගාරයෙන් ලැබුණු සියලුම මුදල් සමුච්චිත අරමුදලෙහි දක්වා ඇත.

**14. ණය ගැණුම්**

ණයට ගැනුම් සාධාරණ වටිනාකමින් ගණුදෙනු පිරිවැය අඩුකර මුලින් හඳුනාගෙන ඇත. ණය ගැණුම් වල ධාරණ අගය වන්නේ ක්‍රමක්ෂය කළ පිරිවැයයි.

**15. සේවක විශ්‍රාම ප්‍රතිලාභ**

**නිර්වචිත ප්‍රතිලාභ සැලසුම්**

සංස්ථාව විසින් සුදුසුකම් ලබා ඇති සියලුම සේවකයන් වෙනුවෙන් 1983 අංක 12 දරණ පාරිතෝෂිත ගෙවීම් පනතෙහි නිර්වචිත ප්‍රතිලාභ සැලසුම් ගෙවයි. ශ්‍රී ලංකා ගිණුම් ප්‍රමිති අංක 19, සේවක ප්‍රතිලාභ, ප්‍රමිතයෙහි නිර්දේශ කර ඇති පරිදි සංස්ථාව විසින් නිර්වචිත ප්‍රතිලාභ, ප්‍රක්ෂේපිත ඒකක ප්‍රතිලාභ ක්‍රමය අනුව වාර්ෂිකව ගණනය කර ඇත.

**16. ආදායම් හඳුනාගැනීම**

මුදල් ලැබෙන දිනය නොසලකා සංස්ථාවට ආර්ථික ප්‍රතිලාභ ලැබීමේ සම්භාවිතාව සහ ආදායම විශ්වාසනීය ලෙස මැනිය හැකි ප්‍රමාණය තෙක් සංස්ථාව විසින් ආදායම් හඳුනා ගනියි.

**17. පුනරාවර්තන වියදම් හඳුනා ගැනීම**

විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයෙහි වියදම් හඳුනාගෙන ඇත්තේ නිශ්චිත ආදායමක් උපයාගැනීම සහ ඒ සඳහා වැය වන පිරිවැය අතර ඍජු සම්බන්ධතාවය පදනම් කරගෙනය. ව්‍යාපාරය පවත්වා ගෙන යාමට සහ ප්‍රාග්ධන වත්කම් කාර්යක්ෂම තත්වයෙන් පවත්වා ගෙන යාමට වැය කළ සියලුම පිරිවැය ප්‍රවර්තන වර්ෂයේ ලාභය ගණනය කිරීමේදී බැර කර ඇත.

**18. ආදායම් බදු**

ආදායම් බදු වියදම යටතේ ප්‍රවර්තන වර්ෂයේ ගෙවිය යුතු බදු සහ විලම්බිත බදු ඇතුළත්ය.

ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාව

**2013.12.31** දිනට

මූල්‍ය තත්ත්ව ප්‍රකාශය

| | 31.12.2013 | 31.12.2012 |
|---|---|---|
| **වත්කම්** | රු. | රු. |
| **ජංගම නොවන වත්කම්** | | |
| දේපල, පිරියත හා උපකරණ | 155,081,533.27 | 160,907,541.43 |
| නෙනිම් වැඩ | 71,492,032.38 | 29,697,763.91 |
| අනෙකුත් මූල්‍ය වත්කම් | | |
| සේවක ණය | 7,555,483.69 | 7,081,084.34 |
| විලම්භිත බදු | 9,876,643.19 | 9,833,002.11 |
| | 244,005,692.53 | 207,519,391.79 |
| **ජංගම වත්කම්** | | |
| තොගය | 144,256,841.12 | 141,265,798.23 |
| මාර්ගස්ථ තොගය | 2,869,330.42 | 1,053,552.67 |
| අනෙකුත් මූල්‍ය වත්කම් | | |
| සේවක ණය | 10,404,303.21 | 9,447,929.32 |
| රත්‍රං තොගය | 5,561,695.00 | 5,561,695.00 |
| මාජින් ගිණුම | 3,874,335.00 | 1,232,247.00 |
| අනේවාසික විදේශ විනිමය | 715,192.62 | 678,756.59 |
| විවිධ තැන්පත් | 3,397,502.00 | 3,534,002.00 |
| ස්ථාවර තැන්පතු (කෙටිකාලීන) | 71,577,603.50 | 66,701,024.35 |
| වෙළඳ ණයගැතියෝ | 86,767,038.00 | 67,726,194.00 |
| කලින් ගෙවීම් හා අත්තිකාරම් | 11,976,280.28 | 21,368,278.67 |
| බැංකු ශේෂය | 38,443,990.32 | 48,329,078.36 |
| | 379,844,111.47 | 366,898,556.19 |
| **මුළු වත්කම්** | 623,849,804.00 | 574,417,947.97 |
| **ස්කන්ධය හා බැරකම්** | | |
| **ස්කන්ධය** | | |
| දායක ප්‍රාග්ධනය | 5,000,000.00 | 5,000,000.00 |
| | 5,000,000.00 | 5,000,000.00 |
| **බාහිර ස්කන්ධය** | | |
| **මහාභාණ්ඩාගාරය** | 238,038,210.00 | 235,038,210.00 |
| **ලෝක සෞඛ්‍ය සංවිධානය** | 3,994,341.00 | 3,994,341.00 |
| **ආයුර්වේද පර්යේෂණායතනය** | 761,274.00 | 761,274.00 |
| | 242,793,825.00 | 239,793,825.00 |
| **සංචිත** | | |
| ප්‍රාග්ධන සංචිත | 1,923,741.00 | 1,923,741.00 |
| ප්‍රත්‍යාගණන ලාභය | 5,522,790.00 | 5,522,790.00 |
| විදේශ විනිමය සමකිරීමේ සංචිතය | 19,523.00 | 19,523.00 |
| පෙර වර්ෂයේ ගැලපුම් (පැකේජය අනුව) | 38,613,358.47 | 37,535,285.60 |
| අනෙකුත් විස්තීරණ ලාභ | 2,751,742.08 | 3,094,830.88 |
| ලාභලාභ ගිණුමේ ශේෂය | 191,546,841.94 | 160,568,264.44 |
| | 240,377,996.49 | 208,664,434.92 |
| | 488,171,821.49 | 453,458,259.92 |
| **වගකීම්** | | |
| **ජංගම නොවන වගකීම්** | | |
| ප්‍රතිපාදන සඳහා වෙන්කිරීම් | 4,193,014.00 | 3,491,314.00 |
| බැංකු ණය | 56,000,000.00 | 60,000,000.00 |
| පාරිතෝෂික වෙන්කිරීම් | 25,300,199.27 | 23,013,461.08 |
| | 85,493,213.27 | 86,504,775.08 |
| **ජංගම වගකීම්** | | |
| වෙළඳ ණයහිමියෝ | 12,069,275.00 | 2,582,918.00 |
| ඉදිරි වර්ෂයට ලැබීම් | 417,585.00 | 164,000.00 |
| උපචිත වියදම් | 11,736,530.24 | 9,479,243.98 |
| ටෙන්ඩර් ඇප තැන්පත් | 2,929,197.00 | 3,033,562.00 |
| ගෙවිය යුතු තැන්පත් | 185,361.00 | 203,161.00 |
| ගෙවිය යුතු සේවක ඇප තැන්පත් | 212,813.00 | 206,813.00 |
| ආදායම් බදු ප්‍රතිපාදන | 22,634,008.00 | 18,785,215.00 |
| | 50,184,769.24 | 34,454,912.98 |
| **මුළු ස්කන්ධය හා බැරකම්** | 623,849,804.00 | 574,417,947.98 |

**ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාව**
**2013.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා**
**විස්තීර්ණ ආදායම් ප්‍රකාශය**

| | 2013 | 2012 |
|---|---|---|
| | රු. | රු. |
| විකුණුම් | 425,450,179.00 | 396,216,099.09 |
| අඩුකළා :- විකුණුම් පිරිවැය | 265,720,560.15 | 246,607,243.87 |
| **දළ ලාභය** | 159,729,618.85 | 149,608,855.22 |
| වෙනත් ආදායම් | 12,611,164.82 | 27,082,235.85 |
| | 172,340,783.67 | 176,691,091.07 |
| අඩුකළා :- ආයතන හා පරිපාලන වියදම් | 77,822,750.63 | 80,407,686.73 |
| විකිණීමේ හා බෙදා හැරීමේ වියදම් | 49,558,421.16 | 36,833,724.50 |
| | 127,381,171.79 | 117,241,411.23 |
| **ක්‍රියාකාරකම් වලින් ලද ලාභය** | 44,959,611.88 | 59,449,679.84 |
| ශුද්ධ මූල්‍ය ආදායම/ වියදම | (2,703,943.46) | 3,281,712.24 |
| බදු අඩුකිරීමට පෙර ලාභය | 42,255,668.42 | 62,731,392.08 |
| අඩුකළා :- ලාභය මත බදු වෙන්කිරීම් | 11,277,090.92 | 26,136,699.45 |
| **බදු පසු ශුද්ධ ලාභය** | 30,978,577.50 | 36,594,692.63 |
| **අනෙකුත් විස්තීර්ණ ආදායම්** | | |
| පාරිතෝෂික ආයුගණන ලාභය/(ආලාභය) | (343,088.80) | 3,094,830.88 |
| **වර්ෂය සඳහා මුළු විස්තීර්ණ ආදායම්** | (343,088.80) | 3,094,830.88 |
| **වර්ෂයේ ලාභය** | 30,635,488.70 | 39,689,523.51 |

**ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාව**
**2013.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා**
**නිෂ්පාදන ගිණුම**

| | 2013<br>රු. | 2012<br>රු. |
|---|---|---|
| **<u>අමුද්‍රව්‍ය පරිභෝජනය</u>** | | |
| ආරම්භක තොගය | 68,058,659.00 | 45,863,857.00 |
| එකතු කළා :- ගැණුම් | 136,605,366.00 | 156,340,938.00 |
| ගැණුම් ආනයන | 384,546.00 | 2,789,328.00 |
| | 205,048,571.00 | 204,994,123.00 |
| අඩුකළා :- තොග හානි | - | 33,510.00 |
| | 205,048,571.00 | 204,960,613.00 |
| අඩුකළා :- අවසාන තොගය | 51,129,741.00 | 68,058,659.00 |
| **පරිභෝජනය කළ අමුද්‍රව්‍ය පිරිවැය** | 153,918,830.00 | 136,901,954.00 |
| **<u>ඇසුරුම් ද්‍රව්‍ය පරිභෝජනය</u>** | | |
| ආරම්භක තොගය | 11,357,499.00 | 10,459,770.00 |
| එකතු කළා :- ගැණුම් | 22,242,376.00 | 21,902,198.00 |
| | 33,599,875.00 | 32,361,968.00 |
| අඩුකළා :- අවසාන තොගය | 10,684,760.00 | 11,357,499.00 |
| **පරිභෝජනය කළ ඇසුරුම් ද්‍රව්‍ය පිරිවැය** | 22,915,115.00 | 21,004,469.00 |
| සෘජු ශ්‍රම වියදම් | 49,705,875.01 | 40,662,337.08 |
| ආරම්භක දැව්තෙල් තොග | 762,190.00 | 498,865.00 |
| වෙනත් සෘජු වියදම් | 13,571,920.00 | 11,942,395.00 |
| අඩුකළා :- අවසාන දැව්තෙල් තොග | 252,000.00 | 762,190.00 |
| | 63,787,985.01 | 52,341,407.08 |
| **ප්‍රාථමික පිරිවැය** | 240,621,930.01 | 210,247,830.08 |
| **<u>කම්හල් පොදුකාර්යය පිරිවැය</u>** | | |
| එකතුකළා :- ආරම්භක නොනිමි | 6,251,170.26 | 4,409,278.00 |
| වක්‍ර වියදම් | 40,843,311.63 | 41,153,681.78 |
| අඩුකළා :- අවසාන නොනිමි | 9,071,213.00 | 6,251,170.26 |
| | 38,023,268.89 | 39,311,789.52 |
| **වර්ෂයේ මුළු නිෂ්පාදන පිරිවැය වෙළඳ ගිණුමට ගෙන ගියා** | 278,645,198.90 | 249,559,619.59 |

ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාව
**2013.12.31 න් අවසන් වර්ෂය සඳහා**
මුදල් ප්‍රවාහ ප්‍රකාශය

| | 2013 | 2012 |
|---|---|---|
| | රු. | රු. |
| **මෙහෙයුම් කටයුතු** | | |
| බදුපෙර ලාභය | 42,255,668.42 | 62,731,392.08 |
| | | |
| **ගැලපීම්** | | |
| විවිධ වෙන්කිරීම් | 701,700.00 | 246,858.00 |
| වත්කම් ක්ෂයවීම් | 11,765,787.23 | 11,731,888.74 |
| ගොඩනැගිලි ඉවත් කිරීමේ අලාභය | - | 2,131,823.99 |
| ශුද්ධ මෙහෙයුම් නොවන ආදායම් | (3,762,925.00) | (9,156,553.36) |
| පාරිතෝෂික දීමනා ගැලපීම් | 3,301,569.39 | 3,259,099.59 |
| රත්‍රං ප්‍රත්‍යාගණනය | - | (3,720,050.00) |
| **කාරක ප්‍රාග්ධනය වෙනස්වීමට පෙර ලාභය** | 54,261,800.04 | 67,224,459.04 |
| | | |
| **කාරක ප්‍රාග්ධන වෙනස්වීම** | | |
| තොග (වැඩිවීම) / අඩු වීම | (2,991,042.89) | (27,496,071.23) |
| මාර්ගස්ථ තොග (වැඩිවීම) /අඩු වීම | (1,815,777.75) | (784,386.67) |
| සේවක ණය (වැඩිවීම) / අඩු වීම | (1,430,773.24) | (742,169.11) |
| කළින් ගෙවීම් හා අත්තිකාරම් (වැඩිවීම) /අඩු වීම | 9,391,998.39 | (19,396,212.64) |
| විවිධ තැන්පත් (වැඩිවීම) / අඩු වීම | 136,500.00 | (334,000.00) |
| ණයගැතියෝ (වැඩිවීම) / අඩු වීම | (19,040,844.00) | 4,445,262.00 |
| ණයහිමියෝ වැඩිවීම / (අඩු වීම) | 9,486,357.00 | (5,985,505.00) |
| ගිණුම්කරණ පැකේජයේ වෙනස වැඩිවීම / (අඩු වීම) | 1,078,072.87 | (721,614.95) |
| ඉදිරි වර්ෂයට ලැබීම් වැඩිවීම / (අඩු වීම) | 253,585.00 | (76,000.00) |
| ටෙන්ඩර් ඇප තැන්පත් වැඩිවීම / (අඩු වීම) | (104,365.00) | 2,424,050.00 |
| ගෙවිය යුතු තැන්පත් වැඩිවීම / (අඩු වීම) | (17,800.00) | 107,369.29 |
| ගෙවිය යුතු සේවක ඇප තැන්පත් වැඩිවීම / (අඩු වීම) | 6,000.00 | 133,576.00 |
| උපචිත වියදම් වැඩිවීම / (අඩු වීම) | 259,852.26 | (584,961.49) |
| **කාරක ප්‍රාග්ධනය වෙනස්වීමෙන් පසු මෙහෙයුම් ලාභය** | 49,473,562.68 | 18,213,795.24 |
| | | |
| අඩුකළා :- පාරිතෝෂික දීමනා ගෙවීම | (1,069,500.00) | (573,661.90) |
| බදු ගෙවීම | (2,000,000.00) | (5,536,364.00) |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහය** | 46,404,062.68 | 12,103,769.34 |
| | | |
| **ආයෝජන කටයුතු** | | |
| ස්ථාවර වත්කම් වෙනස් වීම | (5,939,779.07) | (131,413,983.16) |
| නෙනිම් වැඩ වෙනස් වීම | (41,794,268.47) | (5,251,945.91) |
| ස්ථාවර තැන්පතු වෙනස් වීම | (4,876,579.15) | (40,758,815.32) |
| මාජින් ගිණුමේ වෙනස් වීම | (2,642,088.00) | (1,210,022.00) |
| අනේවාසික විදේශ විනිමය ගිණුමේ වෙනස් වීම | (36,436.03) | (266,535.59) |
| | | |
| **අයෝජන ක්‍රියාකාරකම්වලින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහය** | (55,289,150.72) | (178,901,301.98) |
| | | |
| **මූල්‍ය කටයුතු** | | |
| මහා භාණ්ඩාගාරයෙන් ලද ප්‍රතිපාදන | 3,000,000.00 | 106,000,000.00 |
| බැංකු ණය, පොළී ආපසු අයකර ගැනීම | (4,000,000.00) | 60,000,000.00 |
| **මූල්‍ය කටයුතු වලින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහය** | (1,000,000.00) | 166,000,000.00 |
| | | |
| මුදල් හා මුදල් හා සමාන දෑ අතර ශුද්ධ වෙනස් වීම | (9,885,088.04) | (797,532.64) |
| | | |
| **2013.01.01 මුදල් හා මුදල් හා සමාන දෑ** | 48,329,078.36 | 49,126,611.00 |
| **2013.12.31 මුදල් හා මුදල් හා සමාන දෑ** | 38,443,990.32 | 48,329,078.36 |

| | 2013 | 2012 |
|---|---|---|
| | රු. | රු. |
| මහජන බැංකුව - ගංගොඩවිල -ගි.අ . 97100-182315453 | 15,116,387.58 | 26,124,387.09 |
| මහජන බැංකුව - ගංගොඩවිල -ගි.අ . 97100-272315453 | 5,519,183.66 | 6,992,520.57 |
| ලංකා බැංකුව-ආයතන ශාඛාව-ගි.අ .00001209 | 17,448,419.08 | 15,212,170.70 |
| ඉතිරි කිරීමේ ගිණුම | 360,000.00 | - |
| | 38,443,990.32 | 48,329,078.36 |

## 2013 ස්කන්ධය හා ස්කන්ධ ප්‍රාග්ධනය වෙනස්වීම් ප්‍රකාශය
## (STATEMENT OF CHANGES IN EQUITY FOR 2013)

| විස්තරය | දායක ප්‍රග්ධනය (රු.) | මහාභාණ්ඩාගාරය (රු.) | ලෝක සෞඛ්‍ය සංවිධානය (රු.) | අමාත්‍යාංශ හා රාජ්‍ය ආයතන (රු.) | ප්‍රාග්ධන සංචිත (රු.) | ප්‍රත්‍යාගණන සංචිත (රු.) | පරිසණක පැකේජය අනුව සංචිතය (රු.) | විදේශ විනිමය සමකිරීමේ සංචිතය (රු.) | ලාභලාභ ගිණුම (රු.) | අනෙකුත් විස්තීරණ ලාභ (රු.) | එකතුව (රු.) |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 2012.12.31 දිනට ශේෂය | 5,000,000 | 235,038,210 | 3,994,341 | 761,274 | 1,923,741 | 5,522,790 | 37,535,286 | 19,523 | 160,568,264 | 3,094,831 | 450,363,429 |
| වර්ෂය තුල ගැලපීම් | | 3,000,000 | | | | | 1,078,073 | | 30,978,578 | (343,089) | 34,713,562 |
| 2013.12.31 දිනට ශේෂය | 5,000,000 | 238,038,210 | 3,994,341 | 761,274 | 1,923,741 | 5,522,790 | 38,613,358 | 19,523 | 191,546,842 | 2,751,742 | 485,076,991 |

## ගිණුම් සටහන් (NOTE TO ACCOUNTS)

1. 2013.12.31 දිනට සංස්ථාවේ තොග තත්වය පහත දැක්වේ.

| | | |
|---|---|---|
| 1. | අමුද්‍රව්‍ය තොගය (පිරිවැය) | රු.51,129,741.35 |
| 2. | නිමි ඖෂධ තොගය (පිරිවැය) | රු.71,896,683.52 |
| 3. | ඇසුරුම් තොගය (පිරිවැය) | රු.10,684,760.06 |
| 4. | නොනිමි තොගය ( පිරිවැය) | රු. 9,071,213.23 |
| 5. | ලිපිද්‍රව්‍ය තොගය (පිරිවැය) | රු. 531,983.41 |
| 6. | දැවිතෙල් තොගය ( පිරිවැය) | රු. 252,000.00 |
| 7. | යන්ත්‍ර අමතර කොටස් තොගය | රු.583,834.50 |
| 8. | සුහසාධන ද්‍රව්‍ය | රු.106,625.05 |

2. 2013.12.31 දිනෙන් අවසන් වු වර්ෂය සඳහා විගණන ගාස්තු වශයෙන් රු. 650,000.00 ක ප්‍රතිපාදන වෙන් කර ඇත.

3. වර්ෂය තුළ සංස්ථාවේ ලාභය මත රු. 11,320,732.00 ක ආදායම් බදු වෙන් කිරීම ගිණුම්වල ගැලපීම් කර ඇත.

4. පහත දැක්වෙන නඩු ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාව පාර්ශවකරුවෙකු කරගෙන විභාග වෙමින් පවති.

| පාර්ශවය | තනතුර | නඩු අංකය | අධිකරණය | චෝදනා ස්වභාවය |
|---|---|---|---|---|
| එම්.කේ.සෝමදාස මයා | ගබඩා පාලක | W/P/HCCRMT/78/07 F | ශ්‍රේෂ්ඨාධිකරණය | අවු.55 න් විශ්‍රාම යැවීම |
| එස්.එල්. කැකිරිදෙනිය මයා | සැපයුම් කළමණාකරු | HC/ALT/02/2011 | මහාධිකරණය - කොළඹ | කම්. විනි.සභා විරුද්ධව |
| ආර්.එම්. ලංකාතිලක මයා | ආරක්ෂක නිලධාරි | HC3755/07 | මහාධිකරණය - කොළඹ | ජංගම අලෙවි මුදල් වංචාව |
| මැච්මා කොච්රන් පුද්.සමාගම | සැපයුම්කරුවෙකි | ARB/229/2013 සහ ARB/1622013 | වාණිජ මහාධිකරණය | ස්ටීම් බොයිලේරුව සැපයීම වෙනුවෙන් ඇති මුදල් |

5. ආනයනික අමුද්‍රව්‍ය හා යන්ත්‍ර අමතර කොටස් ආනයනය කිරීම සඳහා ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාව හා මහජන බැංකුව ගංගොඩවිල ශාඛාව සමග ණයවර ලිපි මගින් ගිවිසුම් වලට එළඹ ඇත.

6. සංස්ථාවේ රත්‍රං තොගය 2013.11.28 වන දින එවකට පැවති මිල අනුව ශ්‍රී ලංකා මහ බැංකුවේ ජාත්‍යාන්තර ශාඛාවේ තක්සේරුකරු විසින් රු.5,561,695.00 කට තක්සේරු කර ගිණුම් ගත කර ඇත. එහි ඇති ප්‍රකාශිත ලාභය ගිණුම් ප්‍රතිපත්තිවලට අනුකූලව ප්‍රත්‍යාගත ලාභය ලෙස ගිණුම්වල පෙන්වා ඇත.

7. විකුණුම් වලින් ගිණුම් වල පෙන්නුම් කරනු ලබන්නේ දළ විකුණුම් වලින් වට්ටම් අඩු කළ පසු ශුද්ධ විකුණුම් වේ.

8. ගබඩා අංක 01 /02 හා අංක 11 ගබඩා වල ඖෂධ නිෂ්පාදනාගාරයක අත්‍යාවශයෙන්ම තිබිය යුතු මිල කල නොහැකි කෞතුක ඖෂධ වර්ග රාශියක් පවතියි. ඒවායේ වටිනාකම ගිණුම් වල ගැලපීම් කර නොමැති අතර ඒකක වශයෙන් 2013.12.31 වන දිනට පහත දැක්වේ.

| | | |
|---|---|---|
| i. | මුතු සිප්පි කිලෝ | 36.100 |
| ii. | මුව අං කිලෝ | 52.400 |
| iii. | කස්තුරි ගුලි | 23.000 |
| iv. | ශුද්ධ කිරිගරුඩ කිලෝ | 4.400 |
| v. | දැලි පොතු | 2.900 |
| vi. | රිදී තුත්තනායගම් කිලෝ | 0.150 |
| vii. | සුදු ඊයම් කිලෝ | 16.80 |
| viii. | පිත්තල තහඩු කිලෝ | 2.5 |

9. දේශීය වෛද්‍ය අමාත්‍යාංශය හා ආයුර්වේද දෙපාර්තමේන්තුවට අයත් ඔසු ගොවි ව්‍යාපෘති කිහිපයක් සංස්ථාවට තාවකාලිකව භාර දී ඇත. ඒවායේ වත්කම් සංස්ථාව තාවකාලිකව භාරගෙන ඇති අතර දැනට ඔසු ගොවි ව්‍යාපෘති සඳහා වැය දැරීම් සංස්ථාව විසින් සිදු කරනු ලබයි.ඒවායේ නිෂ්පාදන සංස්ථාවේ ඖෂධ නිෂ්පාදනය සඳහා යොදාගෙන ඇත.

10. සංස්ථාවෙහි සැපයුම් කළමනාකරු වශයෙන් සේවය කළ එස් .එල් . කැකිරිදෙනිය මයාට විරුද්ධව කම්කරු විනිශ්චය සභාවේ පවරා තිබූ නඩුවේ තීන්දුව සංස්ථාවට විරුද්ධව ලැබීම නිසා එම නිලධාරියාට ගෙවිය යුතු වන්දි මුදල වන, රු. 2,380,500.00 ක මුදලක් අදාළ ගිණුම් කාලපරිච්ඡේදය තුළ අසම්භාව්‍ය බැරකම් සඳහා වෙන්කිරීම් යටතේ ගිණුම් ගත කර ඇත.

11. සංස්ථාවේ ඖෂධ නිෂ්පාදනය සඳහා අධිකරණ හා උසාවි වලින් පරිත්‍යාග වශයෙන් ලැබෙන අමුද්‍රව්‍ය, ඒවායේ වටිනාකම පවත්නා වර්ෂයේ ටෙන්ඩර් අවම මිල යටතේ ගණනය කර, සංස්ථාවේ විවිධ ආදායම් ලෙසත් අමුද්‍රව්‍ය ගැණුම් ලෙසත් ගිණුම් වල ගැලපීම් කර ඇත.

12. දේශීය වෛද්‍ය අමාත්‍යාංශය සතුව පවතින LC 9184 දරණ ලොරි රථය සංස්ථාවේ ඖෂධ බෙදා හැරීම සඳහා සේවයේ යොදවා ඇත.

13. මෙතෙක් සෘජුවම හඳුනාගත නොහැකිවූ නිමි ඖෂධ ගබඩා නිෂ්පාදනාගාරයෙන් බැහැරව ස්ථාපිත වීම තුළ ඊට අදාළ සේවක පිරිවැය, විකිණීමේ බෙදාහැරීමේ පොදු කාර්ය වැය ලෙසද, නිමි ඖෂධ බෙදාහැරීම සඳහා දරණ ලද අතිකාල පිරිවැය විකිණීමේ බෙදාහැරීමේ පොදු කාර්ය වැය ලෙසද විභජනය කර ඇත.